ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1462— 2006 සැප්තැම්බර් 15 වැනි සිකුරාදා — 2006.09.15

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා පොලිස් සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2006

ඉහත සේවාවල නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ හා දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණ 2006 දෙසැම්බර් මස කොළඹ දී පැවැත්වේ.

02. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකටම එකවර ඉදිරිපත් වීමට හැකි වන පරිදි කාල සටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශය :*

සේවය	*කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය*	*ගැසට් පත්‍රයේ අංකය හා දිනය*	*විෂය නිර්දේශයට අදාළ පරිශිෂ්ඨය*
ශ්‍රී ලංකා පරිපාලන සේවය	I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	1988.06.07 509/07	"අ"
	II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	එම	"ඇ"
	දෙවන භාෂා පරීක්ෂණය	-	"ඉ"
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	2001.07.27 1194/26	"ආ"
	II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	එම	"ඇ"

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ විෂයයන් සඳහා එක වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයකදී හෝ පෙනී සිටීමට නිලධාරීන්ට අවසර තිබේ. කෙසේ වුවත් නියම කර ඇතිකාලසීමාව තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම අත්‍යවශ්‍ය වේ.

දෙවන භාෂාව විෂයයට පෙනී සිටින නිලධාරීන් සඳහා වූ වාචික පරීක්ෂණයන් එක මධ්‍යස්ථානයක දී පැවැත්වීමට කටයුතු කරනු ඇත.

04. *(අ)* එක් එක් සේවාවල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා වන විෂයයන් පහත දැක්වේ :

ශ්‍රී ලංකා පරිපාලන සේවය

I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය			*II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය*		
විෂය අංකය	*විෂය*	*කාල සීමාව පැය*	*විෂය අංකය*	*විෂය*	*කාල සීමාව පැය*
01	දණ්ඩ නීති සංග්‍රහය හා සාක්ෂි ආඥාපනත	3	20	ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව)	3
02	ශ්‍රී ලංකාවේ නීති ක්‍රම සහ උසාවි සංවිධානය	3	21	සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියා පද්ධති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව)	3
03	ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා	3	22	කළමනාකරණය හා සංවිධානය	3
04	මූල්‍ය ක්‍රම	3			
05	පරිපාලනය	3			
06	ආර්ථික විද්‍යාව	3			
07	සමාජ විද්‍යාව	3			
08	ඉංග්‍රීසි	3			
	දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය			අවශ්‍ය නම් මෙහි සඳහන් අනෙකුත් සේවාවල නිලධාරීන්ට ද දෙවන භාෂා පරීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය.	
09	සිංහල (ලිඛිත)	2			
10	දෙමළ (ලිඛිත)	2			
11	ඉංග්‍රීසි(ලිඛිත)	2			
12	සිංහල (වාචික)				
13	දෙමළ(වාචික)				
14	ඉංග්‍රීසි (වාචික)				

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය

I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය			*II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය*		
විෂය අංකය	*විෂය*	*කාල සීමාව පැය*	*විෂය අංකය*	*විෂය*	*කාල සීමාව පැය*
30	රජයේ මූල්‍ය පටිපාටි	3	36	කළමනාකරණ ගණකාධිකරණය	3
31	නීතිය හා කළමනාකරණය	3	37	රාජ්‍ය මුදල් කළමනාකරණය	3
32	පරිපාලනය	3	38	කළමනාකරණය හා සංවිධානය	3
33	වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම	3		දෙවන භාෂා පරීක්ෂණය (මේ සඳහා ඉල්ලුම් කරන නිලධාරීන් විෂය හා විෂය අංක ශ්‍රී ලංකා පරිපාලන සේවය යටතේ බලන්න)	

ශ්‍රී ලංකා පොලිස් සේවය

විෂය අංකය	*විෂය*	*කාල සීමාව පැය*
80	යුක්තිය පසිඳලීමේ පනත සහ සාක්ෂි ආඥාපනත	3
81	දණ්ඩ නීති සංග්‍රහය සහ පොලිස් ආඥාපනත දෙවන භාෂා පරීක්ෂණය - මේ සඳහා ඉල්ලුම් කරන නිලධාරීන් විෂයය හා විෂයය අංක, ශ්‍රී ලංකා පරිපාලන සේවය යටතේ බලන්න.	3

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය

විෂය අංකය	*විෂය*	*කාල සීමාව පැය*
04	මූල්‍ය ක්‍රම	3
05	පරිපාලනය	3

04. *(ආ)*

විභාගයේ නම	
ශ්‍රී ලංකා පරිපාලන සේවයපළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01
ශ්‍රී ලංකා පරිපාලන සේවයදෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	02
දෙවැනි භාෂාව පිළිබඳ පරීක්ෂණය	03
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයපළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයදෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	02
ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයපළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01
ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයපළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01
ශ්‍රී ලංකා පොලිස් සේවයපළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01
ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයපළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	01

05. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම

ශ්‍රී ලංකා පරිපාලන සේවය	*විෂයය*	*නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම්*
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	නීතිය	බැරිස්ටර්වරයෙකු, ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥවරයෙකු, නීතිඥවරයෙකු, විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ උපාධිධාරියෙකු වීම
	ආර්ථික විද්‍යාව/සමාජ විද්‍යාව	ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිධාරියෙකු වීම
	ඉංග්‍රීසි	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ආධුනික නිලධාරි පුහුණු පාඨමාලාවේ ඉංග්‍රීසි විෂයය සමත්වීම
දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	කළමනාකරණය හා සංවිධානය	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ සහතිකය
දෙවන භාෂා පරීක්ෂණය	සිංහල/දෙමළ/ඉංග්‍රීසි	ප්‍රමාණත්වයක පරීක්ෂණයකින් සමත්ව තිබීම
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	*විෂයය*	*නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම්*
දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	36 කළමනාකරණ ගණකාධිකරණය 37 රාජ්‍ය මුදල් කළමනාකරණය 38 කළමනාකරණය හා සංවිධානය	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් මෙහෙයවනු ලබන රාජ්‍ය මුදල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව; හෝ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය මගින් මෙහෙයවනු ලබන පරිගණක පද්ධති සැලසුම් පිළිබඳ ඉහළ ඩිප්ලෝමාව; හෝ
		ගණකාධිකරණය, වාණිජ්‍යය, කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, පරිගණක විද්‍යාව යන ක්ෂේත්‍රයන්ගෙන් ලැබූ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති/ දර්ශනවේදී (පීඑච්-ඩී) උපාධිය; හෝ වරලත් ගණකාධිකාරී ආයතනය, වරලත් කළමනාකරණය ගණකාධිකාරීන්ගේ ආයතනය, සහතික ලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමය, බ්‍රිතාන්‍ය පරිගණක සංගමය, ඕස්ට්‍රේලියානු පරිගණක සංගමය යන මේවායින් එකක අවසාන පරීක්ෂණය; හෝ මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් ඕනෑම සම මට්ටමේ සුදුසුකම්.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීත් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර– එනම් 2006 සැප්තැම්බර් මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 සැප්තැම්බර් මස 08 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ලක්ෂමන් ගුණවර්ධන
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

රජයේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.

06. භාෂා විෂයයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර හැර අනෙකුත් සියළුම විෂයයන්ට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයීමට අපේක්ෂකයින්ට හැකිවනු සඳහා අවශ්‍ය විධිවිධාන විභාග කොමසාරිස් ජනරාල් විසින් සලසනු ඇත.

07. යම් අපේක්ෂකයෙකු තමාට නිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර මෙහි සඳහන් ආකෘතියට අනුව ඒ 4 කොළයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ඒ 4 කොළයේ 1-6 දක්වා අංක මුල් පිටුවේ එන පරිදි විය යුතුය. ඉහත සඳහන් පරීක්ෂණ දෙකටම පෙනී සිටින්නේ නම් වෙන වෙනම එක් එක් විභාගයන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළයුතුය.

09. ඉල්ලුම්පත්‍ර 2006 ඔක්තෝබර් 16 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත-බත්තරමුල්ල".

10. යම් අපේක්ෂකයෙකුට, තමාගේ විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඒ බව අප්‍රමාදව, විභාග කොමසාරිස් ජනරාල්ට පහත සඳහන් විස්තර සමඟ දැනුම් දිය යුතුය. (විදුලි පණිවුඩ යවන ලිපිනය "විභාග බත්තරමුල්ල" වේ.) :

(i) විභාගයේ නම ;
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම ;
(iii) ලිපිනය ;
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය, හා තැපැල් කාර්යාලය.

11. ඉහත (10) වැනි ඡේදයේ සඳහන් විස්තර සැපයීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කැරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

12. හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 1971 ජූනි මස 29 වැනි දින අංක එස්ඊ 274 දරන චක්‍රලේඛය කෙරෙහි සියළුම අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ. විභාග ශාලාවේදී පහත සඳහන් හැඳුනුම්පත් මගින් තමන්ගේ අනන්‍යතාවය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීම වනු ඇත.

(i) ජාතික හැඳුනුම්පත ;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

13. *විභාග ගාස්තු* පහත දැක්වේ :-

(අ) පළමුවතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක්) සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා :

	රු. ශ.
සම්පූර්ණ විභාගය සඳහා	115 0
එක් විෂයයකට	75 0
වාචික පරීක්ෂණයට	75 0

අපේක්ෂකයින් විසින් අත්සන තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 24 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ශ්‍රී ලංකා පරිපාලන සේවය
"ඇ" පරිශිෂ්ඨය

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වූ පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :-

* නීතිය ;
* මූල්‍ය ක්‍රම ;
* පරිපාලනය ;
* (අ) ආර්ථික විද්‍යාව හෝ (ආ) සමාජ විද්‍යාව ;
* ඉංග්‍රීසි.

(1) නීතිය

විෂයය නිර්දේශය : -

විෂයය අංක 01.– දණ්ඩ නීති සංග්‍රහය සහ සාක්ෂි ආඥාපනත (19 වැනි සහ 14 වැනි පරිච්ඡේදය).

විෂයය අංක 02.– ශ්‍රී ලංකාවේ නීති ක්‍රම සහ උසාවි සංවිධානය, උසාවි ආඥාපනත (6 වැනි පරිච්ඡේදය) සහ 1971 අංක 44 දරන අභියාචනා උසාවි පනත පිළිබඳ මනා දැනුමක් අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තු වේ.

විෂයය අංක 03.– *ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.*– පහත සඳහන් පනත් සහ රාජාඥා විෂයයෙහි (සංශෝධනයන් ඇතුළුව) දැනුමක් අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තු වේ. ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාව 1946 සහ 1947 (379 වැනි අධිකාරය) 1948 අංක 18 දරන පුරවැසි පනත (349 පරිච්ඡේදය) ලංකා පාර්ලිමේන්තු මැතිවරණ රාජාඥාව 1846 (381 වැනි අධිකාරය) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා.

සටහන.– නීතිය පිළිබඳ එක් එක් විෂයයකට අදාළ ලකුණුවලින් සියයට 33 1/3 එක් එක් සාමාර්ථය සඳහා සියයට 40 ක සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ද අපේක්ෂකයින් විසින් ලබාගත යුතුය.

විෂයය අංක 04 – මූල්‍ය ක්‍රම

විෂයය නිර්දේශය : -

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර).

(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තු *උදා* : ඒවා සකස් කිරීම ශීර්ෂ මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්.

සටහන.– සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් සියයට 40 ක් අපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

විෂයය අංක 05 – පරිපාලනය

විෂයය නිර්දේශය :

(අ) කාර්යාල සහ ක්ෂේත්‍ර සංවිධානය සහ ක්‍රම,

(ආ) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII.

සටහන.– සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් සියයට 40 ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

විෂයය අංක 06 – ආර්ථික විද්‍යාව

විෂයය නිර්දේශය :

(අ) ඇගැයීම්, නිපැයුම් හා බෙදා හැරීම් පිළිබඳ න්‍යායයන් කෙරෙහි විශේෂ සැලකිල්ලකින් යුතුව ආර්ථික විද්‍යා මූලධර්ම;

(ආ) මුදල්, බැංකු ක්‍රම, ජාත්‍යන්තර වෙළඳාමෙහි මූල්‍ය ක්‍රම;

(ඇ) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය.

සටහන.– සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් සියයට 40 ක් අපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

විෂයය අංක 07 – සමාජ විද්‍යාව

විෂයය නිර්දේශය :

(අ) සමාජ සැකැස්ම - සංවිධානය සහ ක්‍රියාකාරිත්වය;

(ආ) මානව සබඳතා සහ කණ්ඩායම්වලට බෙදීම;

(ඇ) බන්ධුත්වය, විවාහය සහ පවුල;

(ඈ) ග්‍රාමීය සහ නාගරික සමාජය;

(ඉ) සමාජ ස්ථරායනය සහ විඡේදනය;

(ඊ) සමාජ පාලනය;

(උ) සංස්කෘතිය, ආගම, සදාචාරය සහ ඇගයුම්.

සටහන.– සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් සියයට 40ක් අපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

විෂයය අංක 08 – ඉංග්‍රීසි

විෂයය නිර්දේශය :

(a) *Grammar* .- The following areas will be tested :-
(1) The verb Forms, all the principal tenses of English *e. g.* the Present Simple Tense, the Simple Past, the Future, the Present Perfect, *etc.*
(2) Nouns, Countable, Uncountable
(3) Pronouns
(4) Adjective Degrees of Comparison
(5) Adverbs of Frequency, Work order phrases and sentences
(6) Prepositions
(7) Determiners
(8) Question Words
(9) Model auxiliaries, Can, Could, May, Might,Should, Must, Ought to
(10) The Definite Article
(11) Cardinals/Ordinals
(12) The Passive Construction
(13) Relative Clauses
(14) If Clauses
(15) Reported Speech
(16) There is/There are
(17) Have/Has.

(b) *Vocabulary :* The vocabulary tested will be that of General Modern English with special emphasis on the following fields : Management, Administration and Social and Economic Development.

(c) *Reading :* Ability to - (i) Understand the sense of a passage and the writer's attitude to the subject ; (ii) Grasp the draft of an argument ; (iii) Draw implications from what is written.

(d) *Writing :* Ability to write Essays, Departmental Reports, Official Letters, Circulars, Minutes, Memos, fill in forms.

(e) *Speech :* Ability to speak fluently in the following situations :
(i) Social English *e. g.* – Greetings, Introductions, Farewells, Requests, Conveying information.
(ii) Speaking over the telephone.
(iii) Interview skills, Questioning and Answering Orally.
(iv) Meetings, making speeches, proposing a Vote of Thanks .

(f) *Listening* : Listening to speeches, lectures, dialogues and conversations and the ability to understand and respond to what is said.

SCHEME OF EXAMINATION

1 *Written Examination* : There will be one paper of 3 hours duration.

2. *Oral Examination* : The Oral Examination will consist of 2 parts.

The candidate will be expected to perform these tasks :
(a) Carry on a conversation ;
(b) Describe a picture ;
(c) Read aloud from a passage ;
(d) Listen to and write down a passage of dictation of about 80 words.

Note : A candidate will be required to obtain minimum 40 percent of the total marks for a pass.

"ඈ" පරිශිෂ්ඨය

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය II වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ

විෂයය නිර්දේශය :

* ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය (ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් සහිතව),
* සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියා පද්ධතිය (ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් සහිතව),
* කළමනාකරණය සහ සංවිධානය.

විෂයය අංක 20 – ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය (ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් සහිතව)

ශ්‍රී ලංකාවේ ආර්ථික සමාජ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී බලපාන කරුණු ගැන විභාගාපේක්ෂකයාගේ දැනීම පරීක්ෂා කිරීම පිණිස මෙහි විෂයය පිළිබඳ ප්‍රශ්න සකස් කරනු ඇත. ව්‍යවහාරික ආර්ථික විද්‍යාව සහ ව්‍යවහාරික සමාජ විද්‍යාව පිළිබඳ මූලධර්ම ගැන මෙන්ම ශ්‍රී ලංකාවේ මෑත ආර්ථිකය සමාජ හා දේශපාලන ඉතිහාසය පිළිබඳ දැනීමක් විභාගාපේක්ෂකයාගෙන් අපේක්ෂා කෙරේ.

සටහන.– සාමාර්ථයක් සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 40% ක් විභාගාපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතු වේ.

විෂයය අංක 21 – (ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් සහිතව) සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියා පද්ධතිය.

පහත සඳහන් කරුණු ගැන විශේෂ සැලකිල්ලක් සහිතව සංවර්ධන පරිපාලනය පිළිබඳ ආයතන, ඒවායේ ක්‍රියාකාරිත්වය සහ ඒ ඒ ආයතන අතර පවත්නා සම්බන්ධතාවයන් ගැන අවබෝධයක් විභාගාපේක්ෂකයන්ගෙන් අපේක්ෂා කෙරේ.

(අ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන තන්ත්‍රය.

(ආ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන තන්ත්‍රයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාත්මක පසුබිම.

(ඇ) පළාත් පාලනය.

(ඈ) මහජන සංවිධාන.

(ඉ) රාජ්‍ය ව්‍යාපාර සංවිධානය කිරීම.

සටහන.- සාමාර්ථයන් සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 40% ක් විභාගාපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතු වේ.

විෂයය අංක 22 – කළමනාකරණය හා සංවිධානය :

* කළමනාකරණය සහ සංවිධානය පිළිබඳ මූලධර්ම
* එම මූලධර්ම රාජ්‍ය අංශයේ ගැටළු හා ප්‍රශ්න සම්බන්ධයෙන් උපයෝගී කර ගැනීම.
* කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රම හා ශිල්පීය න්‍යායයන් ගැන විභාගාපේක්ෂයාගේ දැනීම මැන ගත හැකි වන අයුරින් මෙම විෂයය පිළිබඳ ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

සටහන.- සාමාර්ථය සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් සියයට 40 ක් විභාගාපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
"ආ" පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වූ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

(අ) පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් පැය තුනක ප්‍රශ්න පත්‍ර 4කින් සමන්විත වේ.

* රජයේ මූල්‍ය පටිපාටි
* නීතිය හා කළමනාකරණය
* පරිපාලනය
* වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම.

(ආ) පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් විෂයයන්ට එකම අවස්ථාවක දී හෝ නිලධාරියා කැමති නම් වෙන් වෙන් අවස්ථාවලදී පෙනී සිටිය හැකිය.

(ඇ) සාමාර්ථය සඳහා අයදුම්කරුවන් සැම ප්‍රශ්න පත්‍රයක් සඳහාම 40%ක් ලකුණු ලැබිය යුතුය.

විෂයය නිර්දේශය :-

විෂයය අංක 30 – රජයේ මුදල් ක්‍රියා පටිපාටි

රජයේ ගණුදෙනුවලට මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාරයේ චක්‍රලේඛ යොදාගැනීම ආදායමට ඇති සම්බන්ධතාවය අනුව මුදල් රෙගුලාසි/ක්‍රියාපිළිවෙත්, වියදම්, විදේශ ආධාර චාර්ෂික හා අතිරේක ඇස්තමේන්තු, රජයේ ණය, සැපයීම්, ටෙන්ඩර්, අග්‍රිම හා අත්තිකාරම් මුදල, අනුභූතා, දිවයිනේ ගිණුම් කාර්යබද්ධ හා ආර්ථික වර්ගීකරණයන්, වැඩසටහන් හා කාර්යසාධන අයවැය, මුදල් අමාත්‍යාවරයාගේ කාර්යයන්, මහා භාණ්ඩාගාරය, ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය, ලේකම්වරු, විගණකාධිපති හා රජයේ ගිණුම් කම්ටුව සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ යොදාගනු ලබන ආකාරය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනීම පරීක්ෂා කෙරේ.

විෂයය අංක 31 – නීතිය හා කළමනාකරණය

නීතිය :

නීතිය පිළිබඳව නිර්වචනය,
ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය,
ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධති,
ගිවිසුම් නීතිය,
නියෝජිතායතන නීතිය,
භාණ්ඩ විකිණීම,
වාරික මුදල් ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීම,
ගණුදෙනු කළහැකි පිලිනයන්,
ඇප සහතික කිරීම,
රක්ෂණය.

කළමනාකරණය :

කළමනාකරණය පිළිබඳ හැඳින්වීම,
කළමනාකරුවන්ගේ කාර්යයන් හා දක්ෂතා,
සැළසුම් ක්‍රියාවලිය හා සංවිධාන මට්ටම් ඇති කිරීම,
සංවිධාන ව්‍යුහය,
මානව සම්පත් කළමනාකරණය,
කාර්ය සාධනය ඇගයීම,
ප්‍රවර්ධනය,
අභිප්‍රේරණය,
නායකත්වය,
සංනිවේදනය,
තීරණ ගැනීම,
ගැටළු නිරාකරණය,
වෙනස්වීම් කළමනාකරණය,
කළමනාකරණ ගැටුම්,
කළමනාකරණ කාලය,
තත්ත්ව චක්‍ර හා නිෂ්පාදන හා ඵලය,
කළමනාකරණ ආචාර ධර්ම හා වගකීම

විෂයය අංක 32 – පරිපාලනය

ආයතන සංග්‍රහයේ 1 වැනි හා 11 වැනි කොටස්වල විධිවිධාන සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කෙරේ.

විෂයය අංක 33 –වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

කළමනාකරණ තොරතුරු සම්බන්ධයෙන් කාලානුරූපවීමේ නිරවද්‍යතාවය සහ පරිපූර්ණ බවෙහි වැදගත්කම :
ආශ්‍රය තොරතුරු පරිහරණය,
කාලානුරූප හා තදුචිත වාර්තා,
රැස්වීම් වාර්තා හා සටහන් ලිවීම,
කළමනාකරණය වාර්තා ව්‍යුහය,
විශේෂයක් දැක්විය යුතු වැදගත් ප්‍රතිඵල,
ප්‍රතිඵල අර්ථකථනය,
විචල්‍යයන් යෝජනා කිරීම,
දත්ත විශ්ලේෂණයේදී සංඛ්‍යානමය ක්‍රම භාවිතය,
කාර්ය සාධන සැසඳීම,
කළමනාකරණ වාර්තාවල අනුපාත හා ප්‍රතිශත භාවිතය,
රේඛා චිත්‍ර මගින් නිරූපනය,
වෘත්තීමය කථා හා දේශනවලට සවන්දීම,
කථනයෙන් දේශන වාර්තා කිරීම,
විෂය මඩුලු සාකච්ඡා,
සම්මන්ත්‍රණ දක්ෂතා,
කථාවක් පැවැත්වීම.

"ඇ" පරිශිෂ්ඨය

(ආ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ නිර්දිෂ්ඨ පත්‍රය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ.

* කළමනාකරණ ගණකාධිකරණය,
* රාජ්‍ය මුදල් කළමනාකරණය,
* කළමනාකරණය හා සංවිධානය.

නිලධාරීන්ගේ මනාපය පරිදි දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා නියමිත විෂයයන් සියල්ලට එකවර හෝ වෙන් වෙන් වශයෙන් හෝ ඔවුනට පෙනී සිටිය හැක. සාමාර්ථයක් ලබා ගැනීම පිණිස එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණුවලින් 40%ක් අපේක්ෂකයන් ලබාගත යුතුය.

විෂයය නිර්දේශය

කළමනාකරණ ගණකාධිකරණය :— පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි.

විෂයය අංක 36 – කළමනාකරණ ගණකාධිකරණය :

නිර්දිෂ්ඨ පත්‍රය :— ගිණුම් ප්‍රතිපෝෂණය පිළිබඳ පාලනය න්‍යාය, විවෘත සහ සංවෘත දරන ක්‍රම මූලික හා ව්‍යවහාරික ප්‍රශස්ත, සම්මත පිරිවැය ක්‍රම, කාර්යඵල ප්‍රමිති සහ ඇගයුම් ප්‍රමිති පිළිබඳ මූලධර්ම සහ ඒවා යොදා ගැනීමේ ව්‍යවහාර ක්‍රම, ප්‍රමිති සංශෝධනය, ඉගෙනුම චක්‍ර සහ අභිප්‍රේරණය නිර්ණය කිරීම, විචලනයන් සහ උපවිචලනයන් විශ්ලේෂණය කිරීම, ඒවායේ වැදගත්කම ඉදිරිපත් කිරීම සඳහා විභාග කිරීම පාලන ගණකාධිකරණයේ චර්යායන්ත අංශයන්, අයවැය ලේඛන සම්පාදනය කිරීමේ සංකල්පය, අයවැය පාලනය පිළිබඳ පරිපාලනය, අයවැය ලේඛන සංග්‍රහය, ස්ථාවර හා නම්‍ය අයවැය ලේඛන, ප්‍රධාන සහ අතුරු අයවැය ලේඛන, අයවැය කේන්ද්‍ර, අයවැය පිළියෙල කිරීමෙහිලා කළමනාකරණ සහභාගිත්වය, මැදිහත්වීම සහ අභිප්‍රේරණය, අයවැය කාලසීමාව සහ ප්‍රධාන අයවැය සාධකය හඳුනා ගැනීම.

විෂයය අංක 37 – රාජ්‍ය මුදල් කළමනාකරණය :

රාජ්‍ය මුදල් කළමනාකරණය.– පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩදෙනු නොලැබේ.

රජයේ ගණකාධිකාරිවරයාගේ කාර්ය භාරය :

රාජ්‍ය මූල්‍ය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නෛතික රාමුව, ආයතනික රාමුව, මධ්‍යම ආණ්ඩුව රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන, සමුපකාර ව්‍යාපාරය යනාදිය.

පාර්ලිමේන්තුවේ පාලනය, මහා භාණ්ඩාගාරයේ කාර්යයන්, ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ඇස්තමේන්තු කාරක සභාව, විගණකාධිපති, රාජ්‍ය ගිණුම් කාරක සභාව, ඒකාබද්ධ අරමුදල, පාර්ලිමේන්තුව මගින් කරනු ලබන පාලනය පිළිබඳ ගැටළු.

මූල්‍ය චක්‍රය, ක්‍රමසම්පාදන වැඩ සටහන් සැකසීම, අයවැය ලේඛන සම්පාදනය අරමුදල් අනුමත කිරීම, ගිණුම් තැබීමේ කටයුතු වාර්තා කිරීම ඇගයුම් සහ විගණනය.

ව්‍යාපෘති අගයනය කිරීම, සේයා මිල ගණන් සහ සංඛ්‍යානමය දත්ත භාවිතය, ගෙවීම් න්‍යාය සහ අපේක්ෂිත අගය තීරණය කිරීම.

පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය.–වට්ටම් කළ මුදල් ප්‍රවාහය, අභ්‍යන්තර ඵල අනුපාතිකය ව්‍යාපෘති තත්වායනය, ව්‍යාපෘති සම්පාදනය සහ අගයනය කිරීම පිළිබඳ ආර්ථික මූල්‍ය හා කළමනාකරණ අංශ සාර්ථක ලෙස ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.

වැඩ සටහන් සම්පාදනය කිරීමේ ශිල්පීය ක්‍රම, ජාල වැඩ විශ්ලේෂණ ක්‍රම භාවිතා කිරීම, සම්පත් පැවරීම, ප්‍රවාහනය පිළිබඳ ගැටලු ප්‍රයෝජනයට ගැනීම හෝ කාලයාගේ අවැමෙන් පිරිහීමට පත්වන වක්කම් සහ එසේ පිරිහීමට පත් නොවන, එහෙත් යම් කලක් පාවිච්චි කිරීමෙන් හෝ කලක් ගතවීමෙන් පසුව නිශ්ඵල බවට පත්වන වක්කම් වෙනුවට වක්කම් යෙදීම, කාර්ය සාධන අයවැය ලේඛන, මූලික ක්‍රම, ස්ථාපනය සහ භාවිතය, කාර්ය සාධනය මැනීම, මිණුම්, වර්ග ඒකක සහ ප්‍රතිමාන තේරීම, ගිණුම් ක්‍රම සහ කාර්ය සාධක විශ්ලේෂණය,

වැඩ සටහන් අයවැය, වැඩ සටහන් ව්‍යුහය, කාර්යයන් අනුව වර්ගීකරණය වැඩ සටහන් කටයුතු වැය ව්‍යාපෘතීන් සහ වැය විෂයයන් ආර්ථික සහ කාර්ය බද්ධ වර්ගීකරණය,

මූල්‍ය පාලන ක්‍රම, වගකීම් භාරය, අභ්‍යන්තර පාලනය සහ මුදල් රෙගුලාසි, අභ්‍යන්තර විගණනය, කාර්යක්ෂමතා විගණනය, කළමනාකරණ විගණනය, විචල්‍යතා විශ්ලේෂණය, ප්‍රාග්ධන අයවැය සම්පාදනය කිරීම පිළිබඳ තීරණය දිගු කාලීන ක්‍රම සම්පාදනය සහ එහි වැදගත්කම, පූර්වකථනය කිරීම නිරවද්‍යතාවය සහ සීමාවන්, අවදානම් විශ්ලේෂණය, තීරණ වෘක්ෂ, සම්භාවිත සාධක.

ප්‍රාග්ධනය සඳහා ඉල්ලුම .— ප්‍රාග්ධන ඵලදායකත්වය සහ ඉපයුම් ඇස්තමේන්තු කිරීම පිළිබඳ ගැටළු, ව්‍යාපෘති ප්‍රමුඛතාවයන් තත්වායනය කිරීමේ දී අවිනිශ්චිතතාවයන් සඳහා ඉඩ තැබීම, පිළිගෙවුම් නිශ්චායකයන්, ඵල අනුපාතිකය ගණනය කිරීම, ශුද්ධ වර්තමාන අගය සහ වට්ටම් කළ මුදල් ප්‍රවාහයේ ප්‍රතිලාභ අයබදු ගැනීමේ බලපෑම, ආයෝජන ප්‍රෝත්සහනය ව්‍යාපෘති පිරිවැය පාලනය සහ පශ්චාත් විගණනය.

හැකියා පිළිබඳ තීරණ .— නිෂ්පාදන ප්‍රකිර්ණකය, නිෂ්පාදනය කිරීම හෝ මිලට ගැනීම, විකල්ප නිෂ්පාදන ක්‍රම, කර්මාන්තශාලා වසාදැමීම පිළිබඳ ගැටළු, මිල කිරීමේ ප්‍රතිපත්ති සහ දායක න්‍යාය, පාරිභෝගික ඉල්ලුම් රටාවන්ගේ බලපෑම, ඉල්ලුමේ නම්‍යතාව, අලෙවි කිරීමේ උපාය මාර්ග, කාර්ය සාධන ඇගයීමේ ශිල්ප ක්‍රම, ලාභදායකත්වය පිළිබඳ නිශ්චායකයන් සහ අනුපාත.

ආයෝජන කරන ලද ප්‍රාග්ධනයෙන් ලබන ඵලදාව, ආයෝජනය කරන ලද ප්‍රාග්ධනයේ ස්වභාවය සහ එය ආගණණය කිරීම, දෙපාර්තමේන්තු අතර සංසන්දනය කිරීමේ කාර්යයන් සඳහා කාර්ය සාධන නිශ්චායකයන් :

පිරිවැය වාසි විශ්ලේෂණය, කාර්ක ප්‍රාග්ධන කළමනාකරණය,
රාජ්‍ය වාණිජ ව්‍යාපාරවල මුදල් පාලනය, අයවැය සම්පාදනය, කළමනාකරණ වාර්තා කිරීම,
ගිණුම් අර්ථකථනය සහ මූදල් අනුපාත භාවිතය,
රාජ්‍ය ව්‍යවසායන්හි මිල නියම කිරීම,
ගිණුම් සැලැස්ම අන්තර්ගත කරුණු, රජයේ වාර්තා සහ රාජ්‍ය ව්‍යාපාර.

සටහන :— සාමාර්ථය සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් සියයට 40ක් විභාගාපේක්ෂකයකු විසින් ලබාගත යුතුය.

විෂයය අංක 38 – කළමනාකරණය සහ සංවිධානය - පැය 3ක ප්‍රශ්න පත්‍රයකි.

කළමනාකරණය සහ සංවිධාන මූලධර්ම පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය, රාජ්‍ය අංශයේ ගැටළු සහ ප්‍රශ්න සම්බන්ධයෙන් මෙම මූලධර්ම භාවිතය මෙන්ම නවීන කළමනාකරණය උපක්‍රම සහ ශිල්ප ක්‍රම පිළිබඳ ඔහුගේ දැනුම නිර්මාණය කිරීම පිණිස මෙම විෂයය අලලා ප්‍රශ්න සකස් කරනු ලැබේ.

"ආ" පරිශිෂ්ඨය

සිංහල

සිංහල පරීක්ෂණය විෂය අංක 09 ලිඛිත හා විෂය අංක 12 වාචික යන කොටස්වලින් සමන්විත වේ. ලිඛිත පරීක්ෂණය පැය 2 ක කාලසීමාවක් සඳහා වන අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න එහි අඩංගු වේ :

(i) ව්‍යාකරණ ;
(ii) නොයෙක් ආකාරයෙන් වැල් අකුරුවලින් ලියන ලද පෙත්සම් හෝ ගම්මුලාදැනි හෝ ග්‍රාමසේවා නිලධාරි වාර්තා ඉංග්‍රීසියට පෙරලීම ;
(iii) ඉංග්‍රීසි රාජකාරි ලිපියකින් හෝ ලේඛනයකින් හෝ ගත් කොටසක් සිංහලයට පෙරලීම.

වාචික පරීක්ෂණය සඳහා පහත සඳහන් දැ අඩංගු වේ :

(i) ඉංග්‍රීසියෙන් ලියා ඇති රාජකාරි කරුණු සිංහලයකු විසින් වටහාගෙන ලියාගත හැකි වන පරිදි සිංහලෙන් කියවීම ;
(ii) සිංහල පෙත්සම් කියවීම ;
(iii) *කථාව හා භාෂා පරිවර්තනය.*–මෙම පරීක්ෂණයේ අදහස වනුයේ ඒ ඒ පංතිවල සිංහල තේරුම් ගැනීමට ද, සාමාන්‍ය කථාවේ දී හා සිරිත් පරිදි කෙරෙන රාජකාරි කටයුතුවලදී තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට ද, අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම වේ.

සටහන .— සාමාර්ථයක් සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 40%ක් විභාගාපේක්ෂකයකු විසින් ලබාගත යුතුය.

දෙමළ

දෙමළ පරීක්ෂණය විෂය අංක 10 ලිඛිත හා විෂය අංක 13 වාචික යන කොටස්වලින් සමන්විත වේ. ලිඛිත පරීක්ෂණය පැය 2ක කාලසීමාවක් සඳහා වන අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න අඩංගු වේ :

(i) ව්‍යාකරණ ;
(ii) නොයෙක් ආකාරයේ වැල් අකුරුවලින් ලියන ලද පෙත්සම් හෝ ගම්මුලාදැනින් හෝ ග්‍රාම සේවා නිලධාරින් වාර්තා ඉංග්‍රීසියට පෙරලීම ;
(iii) ඉංග්‍රීසි රාජකාරි ලිපියකින් හෝ ලේඛනයකින් හෝ ගත් කොටස් දෙමළයට පෙරලීම.

විෂය අංක 13 වාචික පරීක්ෂණය සඳහා පහත සඳහන් දැ අඩංගු වේ :

(i) ඉංග්‍රීසියෙන් ලියා ඇති රාජකාරි කරුණු දෙමළ අයෙකු විසින් වටහාගෙන ලියාගත හැකි වන පරිදි දෙමළෙන් කියවීම ;
(ii) දෙමළ පෙත්සම් කියවීම ;
(iii) *කථාව හා භාෂා පරිවර්තනය* - මෙම පරීක්ෂණයේ අදහස වනුයේ ඒ ඒ පන්තිවල දෙමළ තේරුම් ගැනීමට ද සාමාන්‍ය කථාවේදී හා සිරිත් පරිදි කෙරෙන රාජකාරි කටයුතු වලදී තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට ද අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම වේ.

සටහන.- සාමාර්ථය සඳහා සම්පූර්ණ ලකුණු සංඛ්‍යාවෙන් 40% ක් විභාගාපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

ඉංග්‍රීසි

ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් අපේක්ෂකයින්ගේ දැන ගැනීම පිණිස මෙහි පහළින් දක්වා ඇත.

Part A

(a) Fill in the blanks with the correct form of the verb given within brackets :-

During the last war our country ..... I (be) a British Colony ..... 2 (take) a full part in the war effort. Consequently our tea, rubber and coconut ..... 3 (ship) to Britain at very favourable prices and the foreign exchange we .....4 (earn) ..... 5 (accumulate) as assets. Again during the Korean war in the early fifties our products ..... 6 (fetch) good prices and we ..... 7 (not have) any exchange problem. However, political independence ..... 8 (not given rise) to any effort to ..... 9 (build up) our economy we ..... 10 (be) a nation of consumers goods which ..... 11 (squander) our foreign exchange on consumer goods which .....12 (can produce) locally and incidentally diversified our economy. Over the last decade we ..... 13 (begin) to feel the pinch when our primary products ..... 14 (fail) to command good prices in the world market while our requirements of food both rice and subsidiary food stuffs .....15 (rise) in price.

(a) Fill in the blanks with the correct preposition (where necessary) :–

As Assistant Secretary..... 16 charge..... 17 subjects, it was my duty to convene groups of officers dealing .....18 different aspects of development work in the Ministry ..... 19 time to time. They discussed ..... 20 various problems that they confronted and which they could not cope ..... 21 on their own. We were thus able to share our experience .....22 each other and make concrete proposals ..... 23 the Secretary every month. He in turn put ..... 24 his own plans for discussion ..... 25 these meetings.

(b) Underline the correct letters given within brackets that would complete the spelling of the following words :-

26. har …… ment (rass/as/ass)
27. ember …… (rass/as/ass)
28. tol …… (arreance/ erance/erence)
29. par …… arian (liament/ limen/liment)
30. bal …… ing (let/ lat/ lot)
31. itin …… (erary/arary/erarie)
32. pers …… (everance/everence/ewerence)
33. bour …… (geoise/joursie/juwarsy)
34. prolet …… (ariet/ariat/eriyat)
35. com …… ate (memorr/ emor/memor).

(c) In each of the following statements underline the correct word within brackets :-

36. The inventory was cheked by the Board of (Surveillance/ Survey/Surveyors)
37. At the enquiry I had to be satisfied that the accused officer has (contradicted/contravened/contaminated) the regulations.
38. Every receipt should have a (counterfoil/counterfeit/ counterpane) for the purpose of audit.
39. There was a possibility that the prosecution had (fabricated/ fumigated/promulgate) the evidence.
40. (Discrete/Discretionary/Discriminatory) power was given to the Head of the Department under the relevant Act.
41. The Police Party had (laid/lied/lain) in ambush until the bribe taker arrived.
42. The entire staff turned upon (facilitate/infiltrate/felicitate) the watcher on his retirement.
43. In times of national crisis we must avoid (luxuriant/luxurious) habits.
44. Martial music was played over the radio during height of the battle to keep up the (moral/morale/morals) of the people.
45. Candidates are advised to use (Stationary/Stationery) sparingly owing to the acute paper shortage.

(e)Underline the correct phase in the brackets that means the same as the word or phrase underlined in each sentence.

46. In good Management the boss should, support his staff in their work (back out/back up/back away).
47. The sales and replacement of stock amounted to over Rs. 5,000 (turn out/turn up/turn away).
48. We were warned at the start not to let out work get into arrears (set out/out set).
49. The younger son wasted his father's wealth in a few years (ran over/ran through).
50. I wanted to see the film, but the queue deterred me from going (put away/put off).

Part B

Read the following passage carefully and then answer the questions set out below :-

Most modern political ideals such, for example, as justice, liberty, constitutional Government, and respect for the law or at least the definitions of them, began with the reflection of Greek thinkers upon the institutions of City State, But in the long history of political thought the meaning of such terms has been variously modified and always that meaning has to be understood in the light of the institutions by which the indicates were to be realized and of the society in which those institutions did their work. The Greek City States was so different from the political communities in which modern men live that it requires no small effort of the imagination to picture its social and political life. The Greek Philosophers were thinking of political practices far different from any that have prevailed commonly in modern word, and the whole climate of opinion in which the work was done was different. Their problems though not without their analogies in the preset, were never identical with modern problems and the ethical apparatus by which political life was evaluated and criticized varied widely from any that now prevails. In order to understand at all accurately what their theories meant it necessary first to realize at least roughly what kind of institutions they had in view and what citizenship connected as an effect and as an ideal, to the public for whom they wrote. For this purpose the Government of Athens is especially important, partly because it is the best known, but chiefly because it was an object of special concern to the greatest of Greek Philosophers.

As compared with modern states the ancient City-State was exceedingly small both in area and in population. The numbers were exceedingly uncertain but, a figure somewhat in excess of three hundred thousand would be approximately correct. Such an arrangement of a small territory denominated by a single City was typical off the City State.

In each of the following cases, choose the alternative which in your opinion supports the views expressed in the above passage. Place a tick (right mark) against the correct answer.-

51. Athens is significant for the students of Greek political thought mainly because :-
    (a) it was the most powerful of the Greek City-States ;
    (b) its ideals had been carefully studied by the Greeks themselves ;
    (c) it had the most ideal form of Government ;
    (d) it is the best known of the Greek City-States.
52. Greek political thought was concerned with problems :-
    (a) Entirely unrelated to;
    (b) identical with;
    (c) different from analogous but to.
53. The moral and religious basis of Greek political idea is :-
    (a) very similar to modern moral and religious ideas ;
    (b) unknown ;
    (c) very different from modern moral and religious ideas.
54. It is :-
    (a) easy,
    (b) not at all easy,
    (c) impossible,
    for a modern man to imagine what life was like in a Greek City-State.
55. In comparison with the ancient Greek City States are :-
    (a) very large,
    (b) very small,
    (c) about the same size.
56. The population of an ancient Greek City States was :-
    (a) much less than 300,000,
    (b) over 3 million,
    (c) Just over 300,000.
57. The City-State of Athens comprises :-
    (a) a small territory governed by a singly city,
    (b) a large territory governed by a number of cities,
    (c) a small territory with village councils,
    (d) a large territory with a decentralised administration.
58. At different times in the history of the world people :-
    (a) have thought in basically the same way,
    (b) have thought in different ways,
    (c) have contradicted the views of people of the previous generation.
59. Details of political theory are derived from Greek Political thought :-
    (a) because the Greek City States was very similar to modern states,
    (b) in spite of Greek City State being very different from modern States,
    (c) because modern political theorists are students of Greek Philosophy.
60. The meaning of political ideal at the particular moment in European History since the time of the Greeks can be defined only be :-
    (a) relating it to its context,
    (b) tracing it back to its original meaning among the Greeks,
    (c) investigating the meaning of the Greek word for it,
    (d) taking into account only those features in it which have persisted throughout its history.
61. Write sentences using each of the following words so as to bring out its meaning clearly :-

Arbitration, emoluments, etiquette, consolidate, hypothetical, retrospective, exigencies, evaluate, review, empower.

EITHER

62. Write a letter to the Head of an Educational Institute in an English speaking country, setting out the following information in an orderly manner :-
    (i) The equivalence of our examination certificate to the certificate specified in this letter cannot be determined as the examining authorities in Sri Lanka have not been consulted by the institution concerned in that country.
    (ii) The G. C. E. (Ordinary Level) Credit Pass has been officially equated with an Ordinary Pass in London G. C. E. (Ordinary Level) .
    (iii) The receipt of the letter sent to the Commissioner of Examinations is acknowleged.
    (iv) Any further information in this matter may be obtained from the embassy of the Republic of Sri Lanka in that country.

63. Write a memorandum to the Secretary, Bureau of Standards marking out a case for the adoption of the 24 hour clock in this country stating the advantages of such a measure.

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා පොලිස් සේවයේ, සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2006

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

(විභාගයේ නම කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ දැක්විය යුතුය)

01. (අ) (i) අගට යෙදෙන නම්, මුල් අකුරු සමග :————————,
(සිංහලෙන්/දෙමළෙන්)
(ii) අගට යෙදෙන නම් මුල් අකුරු සමග :————————,
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ආ) (i) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් :————————,
(සිංහලෙන්/දෙමළෙන්)
(ii) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් :————————,
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) :————————,
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. නිලධාරියා ඉල්ලුම් කරන විභාගයේ නම :————————,
සටහන - මෙය සම්පූර්ණ කිරීමට පෙර 4 (ආ) බලන්න.–

04. නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාල අංකය කොටුව තුළ ලියන්න) [ ]
සිංහල-2,දෙමළ-3, ඉංග්‍රීසි-4

05. (i) නිලධාරියා අයත් සේවය :————————,
(ii) එම සේවයට පත් කරනු ලැබූ දිනය :————————,
වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

06. නිවේදනයේ පළමු ඡේදයේ දක්වා ඇති විෂයය අංක සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

06.1(ඉල්ලුම් පත්‍රයේ සඳහන් විෂයයන්වලට අමතරව වෙනත් විෂයයන්වලට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.)

(i) විෂයය අංකය [ ][ ]
(ii) විෂයය අංකය [ ][ ]
(iii) විෂයය අංකය [ ][ ]
(iv) විෂයය අංකය [ ][ ]
(v) විෂයය අංකය [ ][ ]
(vi) විෂයය අංකය [ ][ ]
(vii) විෂයය අංකය [ ][ ]

06.2 දෙවන භාෂා පරීක්ෂණය :
(i) ලිඛිත විෂයය අංකය [ ][ ]
(ii) වාචික විෂයය අංකය [ ][ ]

07. උපන් දිනය : වර්ෂය:————. මාසය:————. දිනය :————.
08. තනතුර :————.
දෙපාර්තමේන්තුවේ නම :————.
09. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිළධාරියෙකු නම්, නිළධාරියා එම සේවයට පත් කරනු ලැබූ දිනය :————.
10. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිළධාරියෙකු නොවේ නම්, නිළධාරියා අයත් සේවය :————.
11. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිළධාරියෙකු නම්, නිළධාරියා ඉල්ලුම් කරන විභාගය :————.
(අදාළ නොවන දෑ කපා හරින්න)
(අ) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (අ) :——.
(ආ) දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ආ) :————.
(ඇ) දෙවැනි භාෂාව පිළිබඳ පරීක්ෂණය (ඇ) :————.
12. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිළධාරියෙකු නොවේ නම් නිළධාරියා ඉල්ලුම් කරන විභාගය (අදාළ නොවන දෑ කපා හරින්න):———— .
13. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විෂයයන් ද වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :————.

පරීක්ෂණය	*විෂයය*	*වර්ෂය*	*මාසය*

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

* මෙම ඉල්ලුම්පත්‍රයට අලවන ලද මුද්දර මව්සින්ම අවලංගු කිරීමට පෙර වලංගු වූ, පාවිච්චි නොකරන ලද ඒවා බව ද ප්‍රකාශ කරමි.

14 ගෙවන ලද විභාග ගාස්තුව රු. :————.

මුද්දර කොටුව

————————,
අපේක්ෂකයාගේ අත්සන.
දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,
ඉදිරිපත් කරමි.

මේ විස්තර දැක්වෙන ..... මයා./මිය./මෙනවියට මෙම විභාගයට පෙනී සිටීමටත්, 04 වැනි ඡේදයේ ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමටත්, ඔහුට/ඇයට සුදුසුකම් ඇත.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුර.

දිනය :————.

09-555

අධ්‍යාපන අමාත්‍යාංශය

පශ්චාත් උපාධි පාඨමාලා සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව
එක්සත් රාජධානිය - 2007

පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව සහ අධි ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ පොදු රාජ්‍ය මණ්ඩලය මගින් පිරිනැමෙන පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා, සුදුසුකම් ලැබුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ප්‍රදානයන් යටතේ පිරිනමනු ලබන ශිෂ්‍යත්ව, එක්සත් රාජධානියේ උසස් අධ්‍යාපන ආයතනයන්හි 2007 ඔක්තෝබර් මාසයෙහි දී ආරම්භවීමට නියමිතය.

02. *අධ්‍යයන ක්ෂේත්‍ර.*–මෙම ශිෂ්‍යත්ව යටතේ අධ්‍යයන ක්ෂේත්‍රයන් තෝරාගැනීම පිළිබඳව සීමා කිරීමක් නොමැත. එසේ වුවද රටේ සංවර්ධන ප්‍රමුඛතාවයනට වඩාත් අදාල වන ක්ෂේත්‍රයන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

03. කාලය.– (අ) *ආචාර්ය උපාධියක් හෝ ඊට සමාන උපාධියක්.*– වර්ෂ 03. එහෙත් මෙම අදාළ කාලය සම්පූර්ණයෙන් ම එකවර ප්‍රදානය නොකෙරේ. දේශීය විශ්ව විද්‍යාලයක ආචාර්ය උපාධියක් සඳහා ලියාපදිංචි වී සිටින අයෙකුට වර්ෂ 01ක පර්යේෂණ කාලයක් සමඟ විභින්න ස්ථානගත වැඩසටහන (Split - site) යටතේ අධ්‍යයනයක් කිරීමට අවකාශ ඇත.
(ආ) *පශ්චාත් උපාධියක් හෝ ඊට සමාන උපාධියක්.*– වර්ෂ 01.
(ඇ) *වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය ප්‍රායෝගික පුහුණුවීම.*– මාස 06.

04. *ශිෂ්‍යත්වය නතර කිරීම.*–අයථා හැසිරීම, අකුමවත් පැමිණීම, අදාළ බලධාරීන්ගේ අවසරයක් නොමැතිව පංතිවලට හෝ නේවාසිකාගාරයට නොපැමිණ සිටීම, අධ්‍යයන කටයුතුවල ප්‍රගතියක් නොදැක්වීම නිසා ;

හෝ

විභාග වලින් සමත්වීමට නොහැකි වීම නිසා ශිෂ්‍යත්වලාභියාගේ ශිෂ්‍යත්වය අදාළ බලධාරීන් විසින් ඕනෑම අවස්ථාවකදී අවලංගු කළ හැකිය.

ඕනෑම ශිෂ්‍යත්වයක් අවලංගු කිරීමේ දී, ශිෂ්‍යත්වලාභියාට තමාගේ ම වියදමින් ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට නියම කිරීමට ඉඩ ඇත.

05. *ශිෂ්‍යත්ව ප්‍රදාන නියමයන්.*– ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභ ඇතුලත් වේ :–
(අ) ශිෂ්‍යත්ව ප්‍රදානය කරන රටට යාමට සහ අධ්‍යයන කටයුතු නිම කිරීමෙන් පසු කෙළින්ම හා වඩාත්ම පිරිමැසුම්දායක මාර්ගයකින් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට ශිෂ්‍ය අනුග්‍රාහක හෝ අනෙකුත් අනුමත ගුවන් ගමන් වියදම් ;
ප්‍රදාන ලැබීමට කලින් සිදු කරන ලද ගමන් සම්බන්ධයෙන් වියදම් ආපසු ගෙවනු නොලැබේ. ශිෂ්‍යත්වලාභියාගෙන් යැපෙන්නන්ටද ගමන් වියදම් ගෙවනු නොලැබේ,
(ආ) පුද්ගලික යැපීම් දීමනා,
(ඇ) අනුමත කළ පාඨමාලා සහ විභාග ගාස්තු,
(ඈ) අදාළ අවස්ථාවන්හිදී පොත් සහ උපකරණ සඳහා ප්‍රදානයන්,
(ඉ) ප්‍රදානය ලැබෙන රට ඇතුළත අනුමත අධ්‍යයන චාරිකා වියදම් සඳහා ප්‍රදානයන්.

06. *සාමාන්‍ය යෝග්‍යතාවය සඳහා අවශ්‍ය සුදුසුකම්.*– සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු වේ :–
(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය,
(ආ) 2007.10.01 දිනට වයස අවුරුදු 40 නොඉක්මවිය යුතුය,
(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් පළමුවන හෝ දෙවන පෙළ (ඉහළ) ගෞරව උපාධියක් හෝ අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සහතික දෙවන පෙළ උපාධියක් ලබා සිටිය යුතුය.

වෛද්‍ය උපාධිධාරියෝ මීට අතිරේක වශයෙන් අදාළ විෂයය සඳහා විශිෂ්ට සාමාර්ථයක් ලබා සිටිය යුතු වෙති. *සටහන* (i) :
(ඇ) රජයේ ආයතනයක විශ්වවිද්‍යාලයක හෝ රාජ්‍ය සංස්ථාවක ර.කියාවේ නිරතව සිටිය යුතු වෙති. සටහන (ii) සහ (iii) ;
(ඉ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය. මේ බව සනාථ කිරීම සඳහා IELTS හෝ TOFEL පරීක්ෂණයට පෙනී සිට ඉහළ ලකුණු මට්ටමක් ලබා තිබිය යුතුය. (IELTS පරීක්ෂණය සඳහා 6.5කට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් ද, TOFEL පරීක්ෂණය සඳහා 550 – 600 අතර ලකුණු සංඛ්‍යාවක්ද අවශ්‍ය වේ.

සටහන්.–
(i) පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවෝ ද ඉහත 06 (ඇ) අවශ්‍යතා සපුරා තිබිය යුතු වෙති.
(ii) තාවකාලික, අනියම් හෝ කොන්ත්‍රාත් පදනමක් යටතේ පත්වීමක් ලබා ඇති අයගේ ද, සේවයේ යෙදී නැති අයගේ ද අයදුම්පත් සලකා බලනු නොලැබේ.
(iii) නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලැබීමෙන් අනතුරුව සේවයෙහි ස්ථිර කිරීමේ පදනම මත පරිවාස සේවා කාලයක පසු වන අපේක්ෂකයින්ට මෙම ශිෂ්‍යත්ව සඳහා අයදුම් කළ හැකිය. එවැනි අවස්ථාවකදී මෙම කරුණ සඳහන් ප්‍රකාශයක් අයදුම්පතෙහි 16 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

07. *විශේෂ යෝග්‍යතා සඳහා අවශ්‍ය සුදුසුකම් :*
සෑම අයදුම්කරුවකු විසින් ම–
1. ව්‍යාපාර පරිපාලනය සහ/හෝ කළමනාකරණය සහ ඊට අදාළ අනෙකුත් අධ්‍යයන ක්ෂේත්‍රයන් සඳහා (GMAT) විභාගයට පෙනී සිටිය යුතුය.
2. ආර්ථික විද්‍යාව හෝ ඊට අදාළ විෂයයන් සඳහා (GRE) විභාගයට පෙනී සිටිය යුතුය.
3. වෛද්‍ය සහ දන්ත වෛද්‍ය ක්ෂේත්‍රයන් සඳහා, වෛද්‍ය සභාවේ සහ දන්ත වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී සිටිය යුතුය.
4. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවෝ බ්‍රිතාන්‍ය කවුන්සලය මගින් පවත්වනු ලබන (IELTS) විභාගයෙන් සමත් විය යුත්තාහ. එහිදී 6.5 ට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය.
5. චිත්‍ර සහ සංගීතය යන විෂයයන් සඳහා, තම අයදුම්පත සමඟ, අදාළ ආදර්ශ කෑති (slides, cassettes) ඉදිරිපත් කළ යුතුය.

08. *අයදුම්පත්* :
(අ) සෑම අයදුම්පතක් ම මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කළ යුතුය.
(ආ) අයදුම්පත බහා එවන කවරයෙහි වම්පස ඉහළ කෙළවර "පොදු රාජ්‍ය මණ්ඩලීය පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව - එක්සත් රාජධානිය - 2007" යනුවෙන් පැහැදිලිව ලියා හෝ යතුරු ලියනය කර එවිය යුතුය.
(ඇ) එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. එයද එක් පාඨමාලාවක් සඳහා පමණක් විය යුතුය.
(ඈ) සෑම අයදුම්පතක් සඳහා ම, ආපසු නොගෙවන රු. 10ක මුද්දරයක් ඇලවිය යුතු වේ. රු. 10ක මුද්දරයක් හෝ මුද්දර අයදුම්පතෙහි මේ සඳහා ම වෙන් කර ඇති කොටුවේ අලවා, අයදුම්කරුගේ අත්සන යොදා අවලංගු කළ යුතුය.
(ඉ) විශ්වවිද්‍යාලයක හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුතු නිළධාරීන් තම අයදුම්පත සිය ආයතන ප්‍රධානියා හෝ රාජ්‍ය සංස්ථාවේ ප්‍රධානියා මගින් යොමුකර නැත්නම් එම අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙයින් ඔවුන් අයදුම්පතෙහි 16 වැනි කොටුවේ සහතිකය නිසි පරිදි සම්පූර්ණ කළ යුතු වේ.
(ඊ) ශ්‍රී ලංකා ජනරජයට, විශ්වවිද්‍යාලයකට හෝ රාජ්‍ය සංස්ථාවකට නියමිත කාල සීමාවක් සේවය කිරීමට ගිවිසුමකින් හෝ බැඳුම්කරයකින් හෝ බැඳී සිටින අපේක්ෂකයකු 2006.10.01 වැනි දින වන විට, ගිවිසුමෙන් හෝ ඔප්පුවෙන් බැඳී සිටින සේවා කාලය සම්පූර්ණ කර සිටිය යුතු වේ. එම ගිවිසුම යටතේ වන අනෙකුත් බැඳීම් සියල්ලෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී සිටි නම් පමණක් එවැනි අපේක්ෂකයින්ගේ අයදුම්පත් පිළිබඳව සලකා බලනු ලැබේ.
(උ) මෙම අයදුම්පතෙහි සඳහන් කිසියම් ප්‍රකාශයක් වැරදි බව අයදුම්කරු තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් පසුව අනාවරණය වුවහොත් ශිෂ්‍යත්ව ප්‍රදානය අවලංගු කරනු ලැබේ.
(ඌ) *අයදුම්පත් භාරගන්නා අවසාන දිනය.*– 2006 ඔක්තෝබර් මස 16 දින ප. ව. 4.00 දක්වා පමණක් අයදුම්පත් භාරගනු ලැබේ.
(එ) එම දිනයට පෙර අයදුම්පත් ලියාපදිංචි නැතැලෙන් පහත දැක්වෙන ලිපිනයට යොමු කළ යුතුය :
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, (උසස් අධ්‍යාපන අංශය), අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ 07.
(ඒ) නිසි මාර්ගයෙන් නොව වෙනත් අයුරින් එවනු ලබන්නා වූ, කිසියම් ආකාරයකින් අසම්පූර්ණ වූ හෝ ප්‍රමාද වී ලැබෙන්නා වූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
(ඔ) මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් කොන්දේසි පූර්ව දැනුම් දීමකින් තොරව ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන රටේ කැමැත්ත පරිදි වෙනස් කිරීමට ඉඩ ප්‍රස්ථාව ඇත.

09. *සම්මුඛ පරීක්ෂණය.*- සුදුසුකම් ලත් සෑම අයදුම්කරුවෙක් ම කොළඹ නියමිත ස්ථානයකදී නියමිත වේලාවක පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත සහ තම යෝග්‍යතාව සනාථ කෙරෙන අනෙකුත් ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ප්‍රතිපූරණය කරනු නොලැබේ.

10. *වෛද්‍ය පරීක්ෂණය.*– තෝරාගනු ලබන අපේක්ෂකයෝ විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු වෙති.

11. *ශිෂ්‍යත්ව සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීම.*–ශිෂ්‍යත්වයක් සඳහා ශ්‍රී ලංකා රජයේ බලධාරීන් විසින් අපේක්ෂකයකුගේ නාම යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීම ඔහුට/ඇයට ශිෂ්‍යත්වයක් දීමක් ලෙස කිසිම අපේක්ෂකයකු විසින් නොසැලකිය යුතුය. නාම යෝජනා පිළිගැනීම, හුදෙක් ම අදාළ ශිෂ්‍යත්ව ප්‍රදාන ආයතනයන්හි අභිමතය පරිදි සිදු වන්නකි. තෝරාගනු ලැබූ අපේක්ෂකයකු, තෝරා ගැනීමෙන් පසු නාම යෝජනාව ප්‍රතික්ෂේප කරන්නේ නම්, අන් කවර හෝ ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා එම අපේක්ෂකයා පිළිබඳව අනාගතයේදී සලකා බලනු නොලැබේ.

12. *නිවාඩු.*- රජයේ නිළධාරීන්ට ශිෂ්‍යත්ව පිළිගැනීම සඳහා නිවාඩු ලබාදීම, ආයතන සංග්‍රහයේ විධි විධානවලට ද, නිවාඩු ලබාගැනීම පිණිස අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී බලපවත්නා දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසිවලට ද යටත් වේ.

13. *ගිවිසුම.*– තෝරාගනු ලබන සෑම අපේක්ෂකයකුම ශිෂ්‍යත්වය සඳහා පිටත්ව යාමට පෙර, ශ්‍රී ලංකා රජය සමඟ පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය.
(අ) නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය නිම කිරීමට ද,
(ආ) පාඨමාලාව හදාරා අවසන් වූ පසු අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ ශ්‍රී ලංකා රජය යටතේ සේවය කිරීමට ද,
(ඇ) තම ගිවිසුමේ සඳහන් කොන්දේසි සහ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම් සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට හා ප්‍රධාන අධිකාරීන්ට දරන්නට සිදු වූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම් ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ආපසු ගෙවීමට ද ශ්‍රී ලංකා රජයට පොරොන්දු විය යුතුය.

14. යම් අපේක්ෂකයෙකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහ ලබාගැනීමට හෝ බලපෑම් කිරීමට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුස්සකු බවට පත් වන්නේ ය.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

ආදර්ශ අයදුම් පත්‍රය

රු. 10 ක මුද්දරය සඳහා කොටුව	අංකය :..... කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

අධ්‍යාපන අමාත්‍යාංශය

පොදු රාජ්‍ය මණ්ඩලීය පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව, එක්සත් රාජධානිය - 2007

1. (අ) මුල්කුරු සමඟ නම (මහතා/මහත්මිය/මෙනෙවිය): _____.
(ආ) මුල්කුරු වලින් කියැවෙන නම් : _____.
2. ලිපිනය : _____.
දුරකථන අංකය : _____.
3. උපන් දිනය : _____.
වර්ෂය : _____ මාසය: _____ දිනය: _____.
4. 2007.10.01 දිනට වයස :
වර්ෂ: _____ මාස: _____ දින: _____.
5. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? : _____.
6. විවාහක ද/අවිවාහකද/වැන්දඹු ද : _____.
7. අධ්‍යාපන /වෘත්තීය/කාර්මික සුදුසුකම් : _____.

විභාගයේ/ සහතිකයේ නම	*වර්ෂය හා මාසය*	*ආයතනය*	*විෂයයන්*	*සාමාර්ථ මට්ටම*

8. දැනට නිරත රැකියාව :

පදවිය	*ආයතනයේ නම*	*දෙපාර්තමේන්තුව*	*මුල්පත්වීමේ දිනය*

9. ඔබ රජයේ/විශ්ව විද්‍යාලයක/සංස්ථාවක සේවකයකු නම්,
(අ) ඔබේ තනතුර ස්ථිර ද, නැතහොත් තාවකාලික ද: _____.
(ආ) ස්ථිර නම් තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටින්නෙහි ද?: _____.
(ඇ) තනතුරෙහි ස්ථිර කරනු ලැබූ ලිපියෙහි අංකය, දිනය හා එය නිකුත් කළ බලධාරියා : _____.
10. (i) අධ්‍යාපනය ලැබීමට කැමති පාඨමාලාව හෝ අධ්‍යයන ක්ෂෙත්‍රය : _____.
(ii) කවර උපාධියක් සඳහා එම පාඨමාලාව හැදෑරීමට ඔබ අදහස් කරන්නේ ද ? (පශ්චාත් /ආචාර්ය) : _____.
11. ශ්‍රී ලංකා රජය හෝ ආධාර/අනුග්‍රහ ලබන වෙනත් ආයතනයක් සමඟ අත්සන් කොට ඇති ගිවිසුම් හා/හෝ බැඳුම්කර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර හා ඒවායින් නිදහස් වීමේ දිනය : _____.
12. මීට පෙර ශිෂ්‍යත්වයක්, අධ්‍යයන චාරිකාවක්, පුහුණුවක් හෝ එවැන්නක් සඳහා විදේශයකට ගියෙහි නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. : _____.
13. සාමාර්ථය ලබා ඇති ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඉහළම විභාගය IELTS ද/ TOFEL ද යන වග : _____.
ලකුණු මට්ටම : _____.
වර්ෂය : _____.
14. පර්යේෂණ පිළිබඳ තොරතුරු හා ප්‍රකාශන ඇතොත් : _____.
15. අනෙකුත් අමතර විස්තර : _____.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වුත්, නිවැරදි වුත් ඒවා බව ද, අවශ්‍ය තොරතුරු කිසිවක් සඟවා නැති බව ද, මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව තේරීම් කිරීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරාගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ශිෂ්‍යත්ව ප්‍රදානය අවලංගු කරනු ලබන බවත් මම දැන සිටිමි.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය: _____.

16. අයදුම්කරු රජයේ අරමුදල් වලින් අනුග්‍රහය ලබන ආයතනයක සේවකයකු නම්,

ආයතන ප්‍රධානියාගේ සහතිකය

(i) (අ) ශිෂ්‍යත්වය යටතේ ලබාදෙන පුහුණුව මෙම ආයතනයට අත්‍යවශ්‍ය/ අත්‍යවශ්‍ය නොවන බවත්,
(ආ) අයදුම්පතෙහි 8, 9, 11 කොටුවල විස්තර නිලධාරියාගේ පුද්ගලික වාර්තා සමඟ සංසන්දනය කර බලන ලදුව, ඒවා නිවැරදි*/මෙහි සඳහන් පරිදි නිවැරදි විය යුතු බවත්,
(ඇ) අයදුම්කරු ඔහුගේ*/ඇයගේ පත්වීමෙහි ස්ථිර කර ඇති බවත්*/..... වැනි දින පත්වීමෙහි ස්ථිර කරනු ලබන බවත්,
(ඈ) ශිෂ්‍යත්වය සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු*/ඇය සේවයෙන් මුදාහැරිය*/ මුදා හැරිය නොහැකි බවත්,
(ඉ) අයදුම්කරුට වැටුප් සහිත* /වැටුප් රහිත නිවාඩු ප්‍රදානය කරනු*/නොකරනු ලබන බවත්

මෙයින් සහතික කරමි.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම : (මහතා/ මහත්මිය/මෙනෙවිය) : _____.
(iii) වෙනත් විශේෂ කරුණු ඇත්නම්,
ආයතනයේ නම : _____.

_____.
ආයතන ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව සමඟ).

දිනය: _____.

(මෙම සහතිකය ආයතන ප්‍රධානියා විසින් පෞද්ගලිකවම අත්සන් කළ යුතුය)
* අනවශ්‍ය වචන කපා හරින්න.

09-651

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

වැඩ මූලික තනතුරට බඳවා ගැනීම

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ වැඩ මූලික III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් 2006.10.09 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන විවෘත තරහ විභාගයක කුසලතා පදනම මත සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුස්සන් තෝරා ගනු ලැබේ.

අදාල තරහ විභාගය 2006.11.19 දින කොළඹ දී / තෝරාගත් නගර වලදී පැවැත්වේ.

02. අධ්‍යාපන සුදුසුකම්.–

2.1 (අ) සිංහල/දෙමළ භාෂාව හා සාහිත්‍ය, ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 06කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබීම ; හා

(*ආ*) ශුද්ධ ගණිතය. ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව, යන විෂයයන් අතුරෙන් විෂයයන් දෙකක් ඇතුළුව එක් වරකදී විෂයයන් තුනකින් අ.පො.ස. (උසස් පෙළ) සමත්ව තිබීම ;

හෝ

සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයයන් දෙක ඇතුළුව විෂයන් තුනකින් අ.පො. ස. (උසස් පෙළ) සමත්ව තිබීම.

2.2 ඉහත අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් විභාගයේ කුසලතාවය අනුව සුදුසුකම් පරීක්ෂාකර බලා පුහුණු කිරීමේ ශ්‍රේණියට අතුළත්කර ගනු ලැබේ. පුහුණු කාලය වසර එකකි. පුහුණු කාලයෙන් පසු වැඩ මූලික සේවාවේ III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. තෝරාගනු ලබන සංඛ්‍යාව අනුමත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50% කි.

2.3 ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සමඟ පහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලින් එක් සුදුසුකමක් සපුරා ඇති අයදුම්කරුවන්ගේ විභාග කුසලතා අනුව සුදුසුකම් පරීක්ෂාකර බලා වැඩ මූලික සේවාවේ III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. එමගින් බඳවා ගනු ලබන සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50%කි.

(*a*) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (විදුලි/විද්‍යුත්) ඩිප්ලෝමාව.

(*b*) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා (විදුලි/විද්‍යුත්) ඩිප්ලෝමාව.

(*c*) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ආයතනය විසින් පිරිනමන ලබන ජාතික උසස් ඉංජිනේරු (විදුලි / විද්‍යුත්) ඩිප්ලෝමාව.

(*d*) විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික (විදුලි/ විද්‍යුත්) ඩිප්ලෝමාව.

සටහන.–අදාළ විවෘත විශ්ව විද්‍යාල පදනම් පාඨමාලාව හෝ තාක්ෂණික සේවා මණ්ඩලය මගින් අනුමත කළ වෙනත් තාක්ෂණික සුදුසුකම් ඇති අපේක්ෂකයන් අ.පො. ස. (සා/පෙළ) සහතිකය ලබා තිබීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

03. විභාග පරිපාටිය :-

(*අ*) තාක්ෂණ දැනුම මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රය (කාලය පැය 1 1/2). ඉහත 2.2 හා 2.3 හි සුදුසුකම් අනුව ඉල්ලුම්කරුවන් සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රශ්න පත්‍ර ලබා දෙනු ඇත.

(*ආ*) බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම (කාලය පැය 2 යි). ඉහත 2.2 හා 2.3 අයදුම්කරුවන් දෙකොටස සඳහාම අදාල වේ.

04. වැටුප් පරිමාණය :–

ප්‍රහුණු කිරීමේ ශ්‍රේණිය.– මාසිකව රුපියල් 12,920.

III ශ්‍රේණිය.– මාසිකව රුපියල් 14,420 – 10 x 140 –රු. 15,820 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව)

05. *වයස් සීමාව.*–අයදුම්කරුවන් 2006.10.09 දින වන විට වයස අවුරුදු 18ට නොඅඩු සහ 40ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ).

06. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .*–බඳවාගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුයි. පත්කරනු ලබන තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

07. රජයේ/අර්ධ රාජ්‍ය සේවයේ නියුතු වූවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි.

08. මෙම නිවේදනයේ නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

10. සුදුසුකම් ලැබුවන් විභාගයට කැඳවනු ලබන අතර ඒ බව සති දෙකකට ප්‍රථම අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ. විභාගය පිළිබඳ තොරතුරු නියමිත කාලයේදී www. health.gov.lk අංක වෙබ් අඩවියේ ඇතුලත් කරනු ඇත.

11. අයදුම්කළ යුතු ක්‍රමය :

(*අ*) අයදුම්කරුවන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගත් අයදුම්පත් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර කිසිදු නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2006.10.09 වේ.

(*ඇ*) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "අංක 2.2/ 2.3 යටතේ වැඩ මූලික තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය. (අදාල නොවන අංකය කපා හරින්න.)

(*ඈ*) අයදුම්පතෙහි "මුද්දර" යන ස්ථානයේ රු. 50ක මුද්දර අලවා එය අයදුම්කරුගේ අත්සන යොදා අවලංගු කළ යුතුය.

ලිපිනය : අධ්‍යක්ෂ (පාලන) 02,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
'සුවසිරිපාය',
385, ප්‍රජා බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

12. අත්සන සහතික කිරීම :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/ අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරී සේවයේ නියුතු නිලධාරියකු/ රජයේ පාසලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/නීතිඥවරයකු, රුපියල් 1,24,080 ට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ නිලධාරියකු වෙතින් අයදුම්කරු අත්සන සහතික කරගත යුතුය.

රංජිත් මලිගස්පේ,
ලේකම්,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 29 වැනි දින,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, බද්දේගම විමලවංශ හිමි මාවත.
කොළඹ 10.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වැඩ මූලික තනතුරට බඳවා ගැනීම
අයදුම්පත්‍රය

විභාගයට ඉදිරිපත් වන මාධ්‍යය (✓ සලකුණ යොදන්න)

සිංහල	දෙමළ	ඉංග්‍රීසි

විභාගයට ඉදිරිපත් වීමට කැමති දිස්ත්‍රික්ක :

01	
02	
03	

01. මුල් අකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):——.
02. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):————.
03. ස්ථිර පදිංචි ලිපිනය හා දිස්ත්‍රික්කය :————.
04. උපන් දිනය :
වර්ෂය :——,. මාසය :——, දිනය:——.
05. 2006.10.09 දිනට වයස : අවුරුදු :——,මාස :——, දින:——.
06. ජාතික හැඳුනුම්පත් අංකය :

07. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ද යන වග :————.
08. ස්ත්‍රී පුරුෂ භාවය :————.
09. විවාහක අවිවාහක භාවය:——.
10. අධ්‍යාපන සුදුසුකම් :————.

අ.පො. ස (සා.පෙළ) :

පළමුවන වාරය		*දෙවන වාරය*	
වර්ෂය :——,	*විභාග අංකය* :——,	*වර්ෂය* :——,	*විභාග අංකය* :——,

විෂයය	*සාමාර්ථය*
01.	
02.	
03.	
04.	
05.	
06.	
07.	
08.	
09.	
10.	

විෂයය	*සාමාර්ථය*
01.	
02.	
03.	
04.	
05.	
06.	
07.	
08.	
09.	
10.	

අ.පො. ස. (උ. පෙළ) විභාගය :
වර්ෂය:————. *විභාගය අංකය* :————.

විෂයය	*සාමාර්ථය*
01.	
02.	
03.	
04.	

11. තාක්ෂණික සුදුසුකම් (සහතිකයේ පිටපතක් අමුණන්න.) :————.
12. වෙනත් සුදුසුකම් :————.
13. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී තිබේද ? (ඔව් නම් විස්තර සපයන්න.) :————.
14. මෙම අයදුම් පතහේ සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මා විසින් කරනු ලැබූ මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් අදාල තනතුර සඳහා මා නුසුදුස්සකු බව පිළිගනිමි.

මුද්දරය

දිනය :————. ————,
අත්සන.

අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..... මා පෞද්ගලිකව අඳුනන බවත් ඔහු 2006..... දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවට සහතික කරමි.

————,
අත්සන සහතික කරන්නාගේ අත්සන.
හා නිල මුද්‍රාව.

09-561

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)
ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන මුද්‍රණ ක්ෂේත්‍රයට අදාළ පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය පිළිබඳ පාඨමාලාව
Certificate Course in Costing and Estimating for Printing Industry

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥා පනත මගින් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා මුද්‍රණ කර්මාන්තයේ ප්‍රථම ව්‍යාක්තීය සන්ධානය වූ තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් මුද්‍රණ ක්ෂේත්‍රයට අදාළ පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව ඔක්තෝබර් මස ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

මෙම පාඨමාලාව මුද්‍රණ ක්ෂේත්‍රයේ නියුතු ඇස්තමේන්තුකරුවන්, ගණකාධිකරණයේ නියැළි නිලධාරීන්, මුද්‍රණ සුපවයිසර්වරුන් සහ කළමනාකාරවරුන්ට මෙන්ම මුද්‍රණ අලෙවිකරණයේ යෙදී සිටින නිලධාරීන්ට ද අභිශයින් ප්‍රයෝජනවත් වන අතර මුද්‍රණ ක්ෂේත්‍රයට ඇතුළුවන නවකයින්ට ද මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වනු ඇත.

එමෙන්ම මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය හා කොළඹ විශ්ව විද්‍යාලය එක්ව මෙහෙයවන මුද්‍රණ ශිල්පය හා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය මූලික සුදුසුකම් ලබා දෙයි. (Advanced Diploma in Printing Technology and Management)

මෙම පාඨමාලාව අඟහරුවාදා සහ සිකුරාදා දිනවල ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා පුරා සති 27 ක් පැවැත්වේ.

පාඨමාලා කාලය : මාස 8යි.

මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි.

පාඨමාලාවේ අන්තර්ගතය :

Course Contents:

Estimating Module
- Definition of an Estimate
  - * Estimate as a sales tool
  - * Estimating as a production tool
- Estimating Practices
  - * Standard Methods

Estimating of Material and Operation Times
Estimating Electronics and Conventional Pre-Press
Estimating Press Operations
Estimating Digital Printing
Estimating Post Press Operations
Estimating paper, inks and other materials
Computerised managing Information System(MIS)
Application of Estimating and costing software packages

Costing Module
- Definition and Elements of Cost
- Introduction to printing processors and applications
- Costing methods and its relevance to the industry
- Inventory and material control
- Labour cost control
- Absorption costing and marginal costing
- Fixed cost, Variable costs and Depreciation
- Budget Centres
- Budgeting and Managing cost accounting information
- Budgeted hourly rates
- Developing BHRs for your company

මේ පිළිබඳ උනන්දුවක් දක්වන අය වෙතොත් පහත ලිපිනයෙන් හෝ දුරකථනයෙන් අමතා ලියාපදිංචි විය හැක.

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.

දුරකථන : 2686162, 2679791
ෆැක්ස් : 2686162
ඊමේල් : sliopreg@sri.lanka.net

09-578

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

බඩු බාහිරාදිය විකිණීම්

අධිකරණ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන නඩුවලින් අයිතිකරුවන් නොමැති රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් භාණ්ඩ 2006.09.30 වැනි දින පෙ. ව. 09.00 සිට ප. ව. 04.00 දක්වා මෙම අධිකරණයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙම නඩු භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිය කියා සිටින යම් තැනැත්තෙකු වේනම් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම අයිතිය පිළිබඳ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

03. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක.

04. අපේක්ෂිත මිළ ඉල්ලීමක් ඉදිරිපත් නොවන ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත්කිරීමට අධිකරණයට බලය ඇත.

05. භාණ්ඩ මිළ දී ගත් වහාම අදාළ මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් භාණ්ඩ ඉවත්කර ගත යුතුය. ගෙවීම සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

06. නඩු භාණ්ඩ මිළ දී ගන්නන් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

එම්. එච්. එම් අජ්මීර්,
අතිරේක දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
මඩකලපුව.

අනුක්‍රමික අංකය	*නඩු අංකය*	*නඩු භාණ්ඩ පිළිබඳ විස්තර*		*ප්‍රමාණය*
01.	ඒ. ආර්. 64/06 (වා)	i	පාපැදි (අංකය නොමැත.)	01
		ii.	පාපැදි (ජී. සී. අයි. 65605	01
02.	ඒ. ආර්. 65/06 (වා).	i	21″ රූපවාහිනී පලුදු වී ඇත	01
		ii.	ඉවත්විදුලි යන්ත්‍ර පලුදුවී ඇත	01
		iii.	සී. ඩී. ප්ලේයර් පලුදු වී ඇත.	01
		iv.	සෝනි බොක්ස් පලුදු වී ඇත	02
03.	ඒ. ආර්. 67/06 (වා)		පාපැදි (අංකය 69280635)	01
04.	ඒ. ආර්. 68/06 (වා)		පොරව	
05.	ඒ. ආර්. 183/06		පාපැදි (අංකය 9118690)	01
06.	ඒ. ආර්. 348/05	i.	රූපවාහිනී (සුනාමියෙන් පලුදු වී ඇත)	04
		ii.	ශීතකරණ (පලුදුවී ඇත)	01
07.	ඒ. ආර්. 349/05		ශීතකරණය (ක්‍රියාකාරී කොටස් නොමැති)	01
08.	ඒ. ආර්. 350/05		රූපවාහිනී (සුනාමියෙන් පලුදු වී ඇත.)	05
09.	ඒ. ආර්. 835/05		කොම්පියුටර් (සුනාමියෙන් පලුදු වී ඇත.)	01
10.	ඒ. ආර්. 968/05	i.	රූපවාහිනී (සුනාමියෙන් පලුදු වී ඇත)	01
		ii.	කොම්පියුටර් මොනිටර් (සුනාමියෙන් පලුදු වී ඇත)	02
		iii.	සීතකරණ (පලුදු වී ඇත)	02
11.	ඒ. ආර්. 1109/05		චතුර පොම්ප (පලුදු වී ඇත)	01
12.	ඒ. ආර්. 1470/05		කරාබු (කැරට් 20,0 05 මිලි ග්‍රෑම්ස්	01
13	ඒ. ආර්. 1918/05		ෆයිබර් බෝට්ටු (පලුදු වී ඇත)	01
14.	ඒ. ආර්. 1919/05	i.	ෆයිබර් (බෝට්ටු (පලුදු වී ඇත.)	01
		ii.	බෝට්ටු එන්ජිම (පලුදු වී ඇත.)	01
15.	ඒ. ආර්. 1998/05		බජාජ් වර්ගයේ යතුරුපැදි	01
			එන්ජින් අංකය ඩී. කේ. එම්බීඑච්එල් 20375 චැසි අංකය ඩීඩීඑෆ්බීඑච්එල් 58930	
16.	ඒ. ආර්. 2035/05	i.	වලලු	01 (ජෝඩු)
			කරාබු	01 (ජෝඩු)
			පෙන්ඩින්	01
			මාල	01
			මුදු (කැරට් 20, 31.5 ග්‍රෑම්ස්)	01
		ii.	තාලි (කැරට් 20, 4, 5 ග්‍රෑම්ස්)	01
		iii.	කරාබු (කැරට් 20, 2.3 ග්‍රෑම්ස්)	01(ජෝඩු)
		iv.	මාල, කරාබු (කැරට් 20,20 ග්‍රෑම්ස්)	
		v.	තාලි (කැරට් 20, 39 ග්‍රෑම්ස්)	01
		vi.	වලලු (කැරට් 16, 13.4 ග්‍රෑම්ස්)	01
		vii.	මාල (කැරට් 16,205 ග්‍රෑම්ස්)	01
		viii.	කරාබු (කැරට් 18, 03 ග්‍රෑම්ස්)	01(ජෝඩු)
		ix.	මුදු (කැරට් 22, 6.3 ග්‍රෑම්ස්)	01
		x.	තාලි (කැරට් 20, 40 ග්‍රෑම්ස්)	01
		xi.	වලලු	03
			මුදු (කැරට් 20, 24.3 (ග්‍රෑම්ස්)	02
		xii.	තාලි (කැරට් 20, 24 ග්‍රෑම්ස්)	01
		xiii.	කරාබු (කැරට් 20, 1.5 ග්‍රෑම්ස්)	01
17.	ඒ. ආර්. 2067/05		පාපැදි (අංක ඒ 3083)	01

අනුක්‍රමික අංකය	නඩු අංකය	නඩු භාණ්ඩ පිළිබඳ විස්තර		ප්‍රමාණය
18.	ඒ. ආර්. 206805	පාපැදි (අංක එච් 5867265)		01
19.	ඒ. ආර්. 2144/05	පාපැදි (අංක 55981966)		01
20.	ඒ. ආර්. 2145/05	පාපැදි (69270106)		01
21.	ඒ. ආර්. 2148/05	පාපැදි (24451397)		01
22.	ඒ. ආර්. 2149/05	පාපැදි (ඒ 49628)		01
23.	ඒ. ආර්. 2150/05	පාපැදි (එම් 839313)		01
24.	ඒ. ආර්. 2163/05	හොන්ඩා වර්ගයේ සුපර්කප් 70 යතුරු පැදි එන්ජින් අංකය : සී 70ඊ 6573412 චැසි අංකය : සී 70 6329495		01
25.	ඒ. ආර්. 269/03 (වා)	i.	යමහ වර්ගයේ බෝට්ටු ඇන්ජින්	01
		ii.	සුසුකි වර්ගයේ බෝට්ටු එන්ජින්	01
26.	2697/ජීසී/03 (වා)	පාපැදි (ජීසීඅයි 8588 ඒ ඒ		01
27.	4215/ජීසී/04/05(වා)	ෆයිබර් ඔරු		01
28.	4537/එම්ටී/05/(වා)	පාපැදි 24013833)		01
29.	38870/ජීසී/00	පාපැදි (55991012)		01
30.	54731/ජීසී/03	වතුර මෝටර්		01
31.	61282/ජීසී/05	i.	පැනසොනික් වර්ගයේ රූපවාහිනී 14″	01
		ii.	පැනසොනික් වීසීඩී ප්ලේයර්	01
32.	63476/ජීසී/05	i.	පොඩි තැල්ල (කැරට් 16, 14 ග්‍රෑම්ස්)	03
		ii.	පොඩි තැල්ල (කැරට් 18, 05 ග්‍රෑම්ස්)	01
33.	66740 ඕඩීඩී/05	පාපැදි (139116)		01
34.	69417/ඕඩීඩී/06	පාපැදි (වීසීඩී) 7421)		01
35.	69465/ඒජී/06	i	උදලු	01
		ii.	සවල්	03
		iii.	පිකස්	01
36.	69898/එප්/06	සවල්		05
37.	69899/එප්/06	i.	සවල්	04
		ii.	පිකස්	02
38.	නඩු අංකය නොමැත	පිකර් නොමැති (බපල්) පෙට්ටි (උස අඩි 2 1/2″ හා පළල අඩි 1 1/2″)		02
39.	නඩු අංකය නොමැත	ඇමී පේයර්		01
40.	නඩු අංකය නොමැත	යකඩ ලිපිගොනු තැබීමේ අල්මාරි (පලුදු වී ඇත.)		01
41.	නඩු අංකය නොමැත	සිවිලින් විදුලිපංකා (පලුදු වී ඇත.)		05

09-508

දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - වැලිමඩ

2006.09.30 දින වෙන්දේසියට නියමිත භාණ්ඩ ලේඛනය

අනුක්‍රමික අංකය	නඩු අංකය	භාණ්ඩ විස්තරය	
01.	65011	සඳුන් දැව	කි. 50 යි
02.	65012	– එම –	කි. 25 යි
03.	66928	– එම –	කි. 10 යි
04.	66929	– එම –	කි. 15 යි ග්‍රෑම් 900යි
05.	ඒ. ආර්. 236	– එම –	කි. 412
06.	65837	ඉයුසු/රොබස්ටා	
		ඉයුසු/සිටිඩෝරා	දැව කැබලි 32 යි
07.	62343	ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස්	දැව කැබලි 56 යි
08.	67357	i. වෙලන් වර්ගයේ දැව කැබලි 08 යි	
		ii. ඉරුම් කියත් 01 යි	
09.	66301	i. ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස් වර්ගයේ දැව කැබලි 04යි	
		ii ඉරුම් බැඳුවක්	
		iii කියත් තලයක්	
10.	66154	i ටුනා වර්ගයේ ලී කැබැලි 03 යි	
		ii ඉරුම් බැඳුවක්	
		iii කියත් තලය	
11.	66153	i ඉරුම් බැඳුවක්	
		ii කියත් තලය	
12.	53560	අධිශීතකරණයක්	
13.	66177	බාල්දි එකයි	
14.	66072	බාල්දි එකයි	
15.	66184	එම	
16.	67235	එම	
17.	67239	එම	
18.	67240	එම	

ජී. එල්. එන්. මයිමුනා මහත්මිය,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වැලිමඩ.

2006 අගෝස්තු මස 22 වන දින,
වැලිමඩ දිසා අධිකරණයේ දී ය.
09 – 564

පොලිස් අධිකාරී කාර්යාලය – රත්නපුර

රත්නපුර පොලිස් කොට්ඨාශයේ පොලිස් අධිකාරී කාර්යාලය සහ I, II III යන පොලිස් දිස්ත්‍රික්කයන්ට ඇතුළත් පොලිස් ස්ථානයන්හි පාවිච්චියට ගනු ලැබූ පහත සඳහන් ද්‍රව්‍යයන්/භාණ්ඩයන් 2006.09.30 වැනි සෙනසුරාදා පෙ.ව. 09.30 ට රත්නපුර පොලිස් අධිකාරී කාර්යාලයට අයත් භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. රත්නපුර පොලිස් අධිකාරී විසින් නියම කරන ලබන අවම මුදල් යටසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි වෙන්දේසි භාරකාර මණ්ඩලයේ අභිමතය පරිදි මෙම ද්‍රව්‍යයන්/භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය එම මණ්ඩලය සතුව පවතී.

03. වෙන්දේසියෙන් මිළට ගනු ලබන ද්‍රව්‍යයන්/ භාණ්ඩයන් එම අවස්ථාවේදීම මුදල් ගෙවා එදිනම ප. ව. 06.00 ට පෙර පොලිස් කාර්යාල භූමියෙන් ඉවත්කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

04. වෙන්දේසියෙන් භාණ්ඩ මිළදී ගනු ලබන අය තම ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

05. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමාගේ නිසි අවසරය ලබාගෙන 2006.09.29 දින පෙ. ව. 10.30 සිට ප.ව. 03.30 දක්වා කාලය තුළ වෙන්දේසිවීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

ජයන්ත කුලතිලක,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
රත්නපුර.

වෙන්දේසියේ විකිණීමට නියමිතව ඇති භාණ්ඩ ලැයිස්තුව

	භාණ්ඩයේ නම	ප්‍රමාණය
01.	ඇළුමිනියම් කේතල්	01
02.	උදලු තල	04
03.	උළු කැට	1910
04.	එකතු කිරීමේ යන්ත්‍ර	10
05.	කතරු	01
06.	කෝප්ප ඇළුමිනියම්	07
07.	කෝප්ප ඇනමල්	07
08.	කේතල් ඇනමල්	01
09.	තාච්චි	02
10.	තිරමන	01
11.	ලී අල්මාරි	01
12.	ලාම්පු (හදිසි)	01
13.	සාස්පාන් (ලොකු)	05
14.	සාස්පාන් (කුඩා)	11
15.	සයිකල් වේන්	01
16.	මල්ටිපොට්	01
17.	මුදල් පෙට්ටි	01
18.	ඇඳන් යකඩ	07
19.	කේතල් (විදුලි)	01
20.	පා පැදි පොම්ප	01
21.	පා පැදි ලෝන්	01
22.	පලමුදු	12
23.	පුටු වානේ	31
24.	පිහියා මේස	01
25.	පුටු කැබලි	09
26.	පුටු ඇඳි	03
27.	පොරෝතල	01
28.	පිහන් ඇනමල්	19
29.	පාපැදි	07
30.	පිහන් ඇලුමිනියම්	26
31.	පුටු වානේ	05
32.	සපත්තු බුරුසු	01
33.	වතුර පිල්ටර්	03
34.	විදුලි පංකා (මේස)	02
35.	විදුලි පංකා (සිවිලිම)	01
36.	බාල්දි (කුඩා)	10
37.	බොයිලේරු	07
38.	කැබිනට්ටු	02
39.	ජෝගු කුඩා ඇනමල්	30
40.	ජෝගු ඇනමල් ලොකු	01
41.	ජනෙල් රෙදි මීටර්	30
42.	කොකු ඇමුණුම් යන්ත්‍ර	10
43.	කල්දේරම් (කුඩා)	02
44.	කල්දේරම් (ලොකු)	07
45.	රූපවාහිනී යන්ත්‍ර	01
46.	යතුරුලියන (සිංහල)	03
47.	යකඩ අල්මාරි	01

09 – 563

නොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

2007 වර්ෂය සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්දය විකිණීම

2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2006.10.20 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්ද ලබාගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, කවරයේ වම් ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කල යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2006.10.20 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. කිසියම් කරුණක් සටහන් නොකල ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලුණුගල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2006.11.21 දින පෙ.ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කල දින, එනම් රේන්ද විකුණු දින ප.ව. 2.00 ට පෙර ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල් වන මාස දෙකක මුදල් කොටසට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කල යුතු ය.

08. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

පී. එස්. පී. අබේවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2006 ඔක්තෝබර් මස 23 වන දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

2007 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තු - ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

2007.01.01 සිට 2007.12.31 දින දක්වා

අනුක්‍රමික අංකය	තැබෑරුමේ නම සහ අංකය	කොට්ඨාශය	තැබෑරුම පිහිටිවිය යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	තැබෑරුම් විවෘත කරන වේලාව	තැබෑරුම් වසන වේලාව	ටෙන්ඩර් තැන්පත් මුදල	ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව
01.	ලුණුගල අංක 2	ලුණුගල	පස්සර ප්‍රාදේශීය සභාවේ ලුණුගල උප කාර්යාලයේ කොට්ඨාස අංක 2හි වරිපනම් අංක 219 දරන කුරුඑකුඹුර වත්ත	පෙ. ව. 11.00 ප. ව. 5.00	ප. ව. 2.00 ප. ව. 8.00	රුපියල් 5000	2006.10.20 පෙ.ව. 10.30

මහදෝව වත්තේ සීමාව තුළ 2007 වර්ෂය සඳහා රා කැන්ටින් බලපත්‍ර අලුත් කිරීමට එම වත්තේ වතු අධිකාරි විසින් ඔහුගේ නිර්දේශය 2006.10.20 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය.

09-632

කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

2007 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2007 ජනවාරි 01 දින සිට 2007 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු 20 වෙනි දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසි වලටද දැනට බලපවත්නා සියළුම සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව 2006.09.29 වෙනි දින පෙරවරු 10.30 දක්වා මව්සින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා, ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබා ගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් "ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය සහ නම ද" පැහැදිලිව ලියා, ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලියා පදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් කටාන ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කල යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය වන 2006.09.29 වැනි දින පෙරවරු 10.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. කිසියම් කරුණක් සටහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කටාන ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2006.11.01 දින පෙරවරු 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණු දින පස්වරු. 2.00 ට පෙර කටාන ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස තුනක රේන්ද මුදල් කොටසට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ඔහුට ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී දැනගතයුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඩබ්. ඒ. ඩී. පී. ලක්ෂ්මන්,
ප්‍රාදේශීය ලේකම්-කටාන.

2006 අගෝස්තු මස 24 වැනි දින,
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනුක්‍රමික අංකය	තැබෑරුමේ නම සහ අංකය	කොට්ඨාශය	තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාශය	තැබෑරුම් විවෘත කරන වේලාව	තැබෑරුම් වසන වේලාව	ටෙන්ඩර් තැන්පත් මුදල	ටෙන්ඩර්භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව
01.	මූකලන්ගමුව අංක 13	කටාන	මූකලන්ගමුව ගමේ පමණක්	පෙ.ව. 11.00 ප.ව. 5.00	ප.ව. 2.00 ප.ව. 8.00	රු. 4000	2006.09.29 පෙ.ව. 10.00
02.	කටුනායක අංක 14	කටාන	කටුනායක ගමේ පමණක්	පෙ.ව. 11.00 ප.ව. 5.00	ප.ව. 2.00 ප.ව. 8.00	රු. 4000	2006.09.29 පෙ.ව. 10.00
03.	ඇත්ගාල අංක 13	කටාන	ඇත්ගාල ගමේ පමණක්	පෙ.ව. 11.00 ප.ව. 5.00	ප.ව. 2.00 ප.ව. 8.00	රු. 500	2006.09.29 පෙ.ව. 10.00
04.	නැ/කටාන අංක 24	කටාන	නැ/කටාන ගමේ පමණක්	පෙ.ව. 11.00 ප.ව. 5.00	ප.ව. 2.00 ප.ව. 8.00	රු. 2000	2006.09.29 පෙ.ව. 10.00
05.	දෙමන්හන්දිය අංක 27	කටාන	දෙමන්හන්දිය ගමේ පමණක්	පෙ.ව. 11.00 ප.ව. 5.00	ප.ව. 2.00 ප.ව. 8.00	රු. 2000	2006.09.29 පෙ.ව. 10.00

09-534

හම්බන්තොට දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම – 2007 වර්ෂය

2007 ජනවාරි මස 01 වන දින සිට 2007 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පහත උපලේඛනයේ විස්තර සඳහන් රා තැබෑරුමේ පැසුනු රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි වලට හා පොදුවේ සෑම සුරාබදු බලපත්‍රයක්ම වෙනුවෙන් දැනට බලපවත්නා හා ඉදිරියට බලපැවැත්විය හැකි කොන්දේසිවලට යටත්ව හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි අංක 01 දරන රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

02. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 5,000 ක් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට තැන්පත් කර ලබා ගත් නියමිත පෝරමය ඉදිරිපත් කල යුතුය. තවද ටෙන්ඩර්කරු විසින් පහත සඳහන් ගැසට් නිවේදනයේ පරිදි වත්කම් සහිත සහතික ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුයි.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කල යුතුය. නියෝජිතයකු විසින් හෝ ලාංඡික නොවූ හා 1982.08.20 දින අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1982 වර්ෂයේ රා රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වන්නන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

04. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කල නොහැකි අතර, පස්දෙනෙකුට වඩා හවුල් වන ටෙන්ඩර් පත්‍ර ද ඉදිරිපත් කල නොහැක.

05. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සීල් තබා කවරයේ වම් පසු මුදුනේ "හම්බන්තොට දිස්ත්‍රික්කයේ අංක 01 දරන රා තැබෑරුමේ රේන්ද සඳහා ටෙන්ඩර් - 2007" යනුවෙන් පැහැදිළි ලෙස සඳහන් කළ යුතුය. ටෙන්ඩර් සහිත කවරය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් 2006.09.29 වන දින පෙ.ව. 10.00 ඉකුත් වීමට පෙර ලැබෙන සේ ඉදිරිපත් කල යුතුය. ටෙන්ඩර් වසන වේලාවේදී සියළුම ටෙන්ඩර්කරුවන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්දය විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතුයි.

07. ටෙන්ඩර් පත්‍රයේ හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ නියමිත හේතූන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. කිසියම් හේතුවක් නිසා ටෙන්ඩර් භාර ගැනීමට නියමිත 2006.09.29 වන දිනට අවලංගු කිරීමට සිදුවුවහොත් නැවත ටෙන්ඩර් භාර ගන්නා දිනය 2006.10.16 වන දින වේ.

09. වැඩි විස්තර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැන ගත හැකිය.

ඩී. එස්. පත්මකුලසූරිය,
ප්‍රාදේශීය ලේකම්,

හම්බන්තොට.
2006 අගෝස්තු මස 07 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

2006 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම

අනුක්‍රමික අංකය	*කොට්ඨාශය*	*ග්‍රාමය*	*ටෙන්ඩර්පත් භාර ගැනීම*	*තැබෑරුම් විවෘතව නිබිය යුතු වේලාවන්*
01	හම්බන්තොට	හම්බන්තොට	2006.09.29 පෙ. ව. 10.00	පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා

09-611

නාරම්මල ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසය
2007 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයන්හි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට, යටත්ව 2006 ඔක්තෝබර් මස 05 වැනි දින පෙ. ව. 10.30 දක්වා නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිලදී ගැනීම සඳහා ඉදිරිපත් වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට, මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල මෙම කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිද, ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි, ලබාගත් වක්කම් සහතිකයක්ද, සහිතව කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නමද, පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් නාරම්මල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් සඳහාම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුයි. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2006 ඔක්තෝබර් මස 05 වැනි දින පෙ. ව. 10.30ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුයි.

05. කිසිම කරුණු දැන්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නාරම්මල ප්‍රාදේශීය ලේකම් සතුවේ.

06. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින්, එසේ ප්‍රකාශ කළ දින ප. ව. 3.00ට පෙර නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

07. 2007 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2007 වර්ෂය සඳහා නොලබන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව ටෙන්ඩරය ප්‍රදානය කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා නාරම්මල ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියද ලබාගත යුතුයි.

08. 2006 ඔක්තෝබර් මස 05 වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත්, 2006 නොවැම්බර් මස 07 වැනි දින පෙ. ව. 10.30ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එල්. එච්. රම්‍යසිරි,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2006 අගෝස්තු මස 28 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනුක්‍රමික අංකය	*කොට්ඨාශය*	*ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව*	*ටෙන්ඩර් තැන්පත් මුදල*	*රා තැබෑරුම් විවෘත කරන වේලාව*	*තැබෑරුම් වැසිය යුතු වේලාව*
			රු.		
01	නාරම්මල	2006.10.05 පෙ. ව. 10.30ට පෙර	1,000	පෙ. ව. 11.00 ප. ව. 05.00	ප. ව. 02.00 ප. ව. 08.00

09-612

උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
රා තැබෑරුම් රේන්ද විකිණීම - 2007 වර්ෂය

2007 ජනවාරි 01 සිට 2007 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස්වරයා විසින් පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලටද, දැනට බලපවත්නා සියළු සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව 2006 ඔක්තෝබර් මස 09 වන දින පෙ. ව. 10.30 දක්වා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිලදී ගැනීමට ඉදිරිපත් වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘත පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප්ගෙන් ලත් මුදල් කුවිතාන්සියක්ද, ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වක්කම් සහතිකයක්ද, සහිතව කවරයක බහා එයට මුද්‍රා තබා එහි ඉහළ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නමද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත් සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරන සෑම වෙනස්වීමක්ම ටෙන්ඩර්කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2006 ඔක්තෝබර් මස 09 වන දින පෙ. ව. 10.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය

05. කිසිම කරුණු දැන්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් සතුවේ.

06. තනි වරප්‍රසාදය මිලදීගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින ප. ව. 2.00 ට පෙර උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

07. 2007 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2007 වර්ෂය සඳහා නොලබන්නේනම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබාගත යුතුය.

08. 2006 ඔක්තෝබර් මස 09 වෙනි දින රේන්ද විකිණීමේ ලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2006 නොවැම්බර් මස 08 වන දින පෙ. ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේදී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එච්. එල්. එස්. විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උඩුබද්දාව.

2006 ක් වූ අගෝස්තු මස 23 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අනුමත රා තැබෑරුම් 2007 වර්ෂය

අංකය හා නම	*පත්තුව යුතු ප්‍රදේශය*	*තැබෑරුම් විවෘත කළ*	*ටෙන්ඩර් තැන්පත් මුදල*	*ටෙන්ඩර් වසන වේලාව හා දිනය*	*තැබෑරුම් විවෘත කළ යුතු වේලාව*	*තැබෑරුම් වැසිය යුතු වේලාව*
			රු.			
උඩුබද්දාව අංක 02	කටුගම්පල හත්පත්තුව	උඩුබද්දාව ගම තුල	250.00	2006.10.09 පෙ.ව. 10.30	පෙ.ව.11.00 සහ ප.ව. 5.00	ප.ව.2.00 සහ ප.ව. 8.00

09-565

දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
2007 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රා තැබෑරුම් වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද රා විකිණීමේ කොන්දේසි වලටද පහත සඳහන් කොන්දේසි වලටද යටත්ව 2006.10.02 දින පෙ. ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි මත ලබාගත් වක්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුම් අංකය සහ නමද පැහැදිළිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල පළ කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර් කරුවන්ගේ සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන 2006.10.02 වැනි දින පෙ. ව. 10.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. කිසියම් කරුණක් සඳහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාව හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් සතුවේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2006.11.02 දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ වරප්‍රසාද මිලදීගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එකී ප්‍රකාශ කල දින එනම් රේන්ද විකුණුම් දින පස්වරු 2.00 ට පෙර දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලින් මාස දෙකක රේන්ද මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ඔහුට ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

යූ. ඒ. එස්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
දිවුලපිටිය.

2006 අගෝස්තු මස 28 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනුක්‍රමික අංකය	*තැබෑරුමේ නම සහ අංකය*	*කොට්ඨාසය*	*තැබෑරුම් පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය*	*තැබෑරුම් විවෘත කරන වේලාව*	*තැබෑරුම් වසන වේලාව*	*ටෙන්ඩර් තැන්පත් මුදල*	*ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව*
						රු.	
01	දාගොන්න-27	දිවුලපිටිය	දාගොන්න	පෙ.ව.11.00 ප.ව. 5.00	ප.ව. 2.00 ප.ව. 8.00	4,000	2006.10.02 පෙ.ව. 10.30

09-572

ආණ්ඩුවේ නොවන දැන්වීම්

නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

වැල්ලව, මකුල් කොටුව වත්තේ පදිංචි හසිත ජනරංජන දයාරත්න වන මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ, සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙතැන් සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

හසිත ජනරංජන දයාරත්න.
නොතාරිස් ප්‍රතිඳාත ලිපිකරු.

2006 අගෝස්තු මස 28 වැනි දින,
මකුල් කොටුව වත්ත,
වැල්ලව.
09-520

නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කුරුණෑගල, තෙලියගොන්න, නුවර පාරේ., අංක 395 පදිංචි, සේගු අබ්දුල් කාදර් ෆාතිමා කිෂාර් වන මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ, සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරියේ 7 වගන්තිය ප්‍රකාර මෙතැන් සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

සේගු අබ්දුල් කාදර් ෆාතිමා කිෂාර්,
නොතාරිස් ප්‍රතිඳාත ලිපිකරු.

2006 අගෝස්තු මස 28 වැනි දින,
අංක 395, නුවර පාර,
තෙලියගොන්න,
කුරුණෑගල.
09-521

ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මීරිගම, රුක්සෙවනහි පදිංචි අල්ගමගේ තිරිස් ජොසසින් සමරනායක වන මා, ඇටොර්නි අධිපති හැටියට, මිනුවන්ගොඩ, පත්තඩුවන පදිංචි හෙට්ටිගේ තිරිස් ලක්ෂිකා අයන්ති පෙරේරා යන අය ඇටෝර්නි බලකරු කරමින් ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඒ. කේ. කී. එල්. ධර්මසේන මහතා ලියා සහතික කල අංක 416 සහ 2002.02.29 දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කල බව සියලු දෙනාගේම දැන ගැනීම පිණිස මෙයින් දන්වමි.

අල්ගමගේ තිරිස් ජොසසින් සමරනායක.
09-504

නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කෙසෙල්වත්ත, ගොරකාන, ගාළු පාර, අංක 415/1, තැන පදිංචි ආඩම්බරගේ සුජීවා කුමාරි ද අල්විස් වන මම, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරියක වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරියේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

ඒ. එස්. කේ. අල්විස්.

2006 සැප්තැම්බර් මස 01 වැනි දින,
අංක 415/1, ගාළු පාර,
ගොරකාන, කෙසෙල්වත්ත.
09-652

නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය, දුන්කන්නාව, උණපදුර පාර, 'අනුරුද්ධ' නිවසේ පදිංචි දිසානායක මුදියන්සේලාගේ පද්මිණී සුජාතා වන මම පුත්තලම, දිස්ත්‍රික්කයේ, සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරියේ 7 වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

ඩී. ඇම්. පද්මිණී සුජාතා.

2006 අගෝස්තු මස 28 වැනි දින.
09-631

නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

පමුණුගම, 'සිරිනිල' හි පදිංචි ජයකොඩිආරච්චි ගුරුනාන්සෙලාගේ දොන් සිරිල් ජුවන් සෙකුන්දාරියුස්

නානායක්කාර වන මම ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා වූ අවසරය 107 වන අධිකාරය වන නොතාරිස්වරු නම්වූ ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාරව මෙදින සිට මසක් ඉකුත් වූ පසුව රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

ජේ. ඩී. සී. ජේ. එස්.නානායක්කාර.

2006 අගෝස්තු මස 30 වැනි දින,
'සිරිනිල'
පමුණුගම.
09–556

නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කඩවත, කෝපිවත්ත, අංක 133 හි පදිංචි හෙට්ටි මුහම්දිරම්ගේ හේමාලි හේමමාලා වික්‍රමසිංහ වන මම ගම්පහ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

එච්. ඇම්. එච්. හේමමාලා වික්‍රමසිංහ.

2006 අගෝස්තු මස 29 වැනි දින,
අංක 133, කෝපිවත්ත, කඩවත.
09-531

නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කඩවත, මහර නුගේගොඩ, අංක 417/බී හි පදිංචි දුල්මිණි විතානගේ වන මම ගම්පහ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

දුල්මිණි විතානගේ.

2006 අගෝස්තු මස 29 වැනි දින,
අංක 417/බී, මහර නුගේගොඩ, කඩවත.
09-532

ඇටර්නි බලකරය අවලංගු කිරීම

රාජගිරිය, ඔබේසේකරපුර, මොරගස්මුල්ල පාර, අංක 215/4, දරන ස්ථානයේ පදිංචි, බ්‍රහක්මනගම ඇල්විටිගලගේ ශ්‍රියාලතා වන මම, රාජගිරිය, ඔබේසේකරපුර, ස්කන්ධ දේවාල මාවත, අංක 7/27 දරන ස්ථානයේ පදිංචි, මාලිගොඩ පතිරනගේ දීපිකා ප්‍රියන්ති යන අයට ප්‍රසිද්ධ නොතාරිස් එස්. චන්ද්‍රා සිල්වා මහතා 1999.11.01 වන දින ලියා සහතික කල අංක 4354 දරන ඇටර්නි බලකරයෙන් දී තිබූ සියළුම බලතල මෙයින් අවලංගු කර සිටින බව උතුම් වූ ශ්‍රී ලංකා ආණ්ඩුවටත්, සියළුම ශ්‍රී ලංකාවාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

බ්‍රහක්මනගම ඇල්විටිගලගේ ශ්‍රියාලතා.

09-533

ඇටර්නි බලය අවලංගු කිරීම

මහනුවර, බෝවල, බෝධියංගන මාවතේ, අංක 92/1බී දරන ස්ථානයේ පදිංචි ශිරානි මල්කාන්ති පෙරේරා වික්‍රමසිංහ යන මම, යූ. ඒ. ප්‍රේමසුන්දර කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මහතා සහතික කළ අංක 2246 සහ 2004.06.10 දින දරන ඇටර්නි බලකරය මගින් තලවතුගොඩ, වීරසේකර මාවතේ, අංක 15 දරන ස්ථානයේ පදිංචි උපාලි ලියනගේ මාගේ ඇටර්නි බලකරු ලෙස පත් කළ අතර, එකී පත් කිරීම මා විසින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන ලද බව මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

එනිසා උපාලි ලියනගේ විසින් මාගේ ඇටර්නි බලකරු ලෙස මා නමින් සහ /හෝ මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මා වග නොකියන බව මම මෙයින් දැනුම් දෙමි.

ශිරානි මල්කාන්ති පෙරේරා වික්‍රමසිංහ.

09–588

නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, සඳලංකාව තැපැල් හෙණ්ඩියගල පදිංචි හේරත් පතිරන්නැහෙලාගේ ජයසිරි හේරත් පතිරණ වන මම, එම දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා, නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස 107 වන අධිකාරයේ 07 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

එච්. ජී. ජේ. එච්. පතිරණ.

2006 අගෝස්තු මස 15 වැනි දින,
හෙන්ඩියගල,
සඳලංකාව.
09-590

රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති අංක 03 පට්ටියගම විදේශ මත්පැන් තැබෑරුම
2007 වර්ෂය සඳහා රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි වලටත්, එම කාලය තුළදී වලංගු සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා දෙල්තොට ප්‍රාදේශීය ලේකම්/අතිරේක දිසාපති තැන වන මා විසින් 2006.10.17 වැනි දින පෙ.ව. 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්ම ලබාගත හැකි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර

අ. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය සහ

ආ. ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ඉදිරිපත් කල යුතුය.

03. ටෙන්ඩර් සහ වත්කම් සහතිකය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යටෝක්ත විදේශ මත්පැන් තැබෑරුම රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගු ව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතුය. :

i. ටෙන්ඩර්පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. එසේ කිරීමේදී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතුය.
ii. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘතිපත්‍රයේ සාක්ෂිකරුගේ අත්සන යොදා තිබිය යුතුය.
iii. සෑම වෙනස්කිරීමක් හෝ වචන කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතුය.

මෙකී අවශ්‍යතාවයන්ට පටහැනිව ඉදිරිපත් කරන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විධිමත් ලෙස ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්පත්‍රය -
(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවූ කුවිතාන්සිය,
(ආ) වත්කම් සහතිකය,

සමග ලියුම්කවරයක බහා සීල් තබා ලියුම් කවරයෙහි වම් කෙළවරෙහි ඉහළින් "තැබෑරුම් අංක සහ නම" සඳහන් කර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන වේලාවට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම දෙල්තොට ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

05. රේන්දය වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව ඉහත සඳහන් 1 වන ඡේදයේ සඳහන් කර ඇත. එකී වේලාවන්වල දී සියළුම ටෙන්ඩර්කරුවන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුයි.

06. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය "වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා" වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ පසු ප.ව. 2.30 ට පෙර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප මුදලක් වශයෙන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන තැබිය යුතුය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවක් විසින් "ගෙවීම් සඳහා" යයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවකින් හෝ "ආරක්ෂිත චෙක්පතක් " නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතක් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතුය.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.
2006 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දිය.
09-602

2006 අංක 277
ඩීආර්එස්/21/ආර්ථසීටී/2269.
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්
පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 17 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.
නි/62628 කපිතන් (උපකරණ පාලක) සිරිල් රාජපක්ෂ, ශ්‍රීලංසිරෙ.
අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.
2006 පෙබරවාරි මස 10 වැනි දින.
කොළඹ දී ය.
09-604

2006 අංක 278
ඩීආර්එස්/21/ආර්ථසීටී/2304.
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්
පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.
නි/64149 ලුතිනන් උක්කුරාලලාගේ ආනන්ද ගාමිණී පියදාස, ශ්‍රීලංකාහ
අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.
2006 මාර්තු මස 09 වැනි දින.
කොළඹ දී ය.
09-599

ඩීආර්එස්/21/ආර්ථසීටී/2293.
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස යුද හමුදා සේවයෙන් පහ කිරීමක්
ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2005 දෙසැම්බර් මස 31 වන දින සිට අපකීර්ති සහගත ලෙස යුද හමුදා සේවයෙන් පහ කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.
නි/64084 2/ලුතිනන් දොන් අසේල ලක්මාල් වලිසිංහ, ගැහේබ.
අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.
2006 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.
09-596

2006 අංක 279
ඩීවීඑස්/ආර්ථසීටී/30(x)ඒවයි.
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්වේච්ඡා බලසේනාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්
පහත නම සඳහන් නිලධාරි 2006 පෙබරවාරි මස 08 දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.
නි/1923 කර්නල් ජයකොඩිආරච්චිගේ දොන් රොමේල් ජයකොඩි
අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.
2006 මාර්තු මස 01 වැනි දින.
කොළඹ දී ය.
09-605

2006 අංක 280
ඩීවීඑස්/ආර්ථසීටී/233 (ii)
ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැන්වීමක්
නිල ස්ථිර කිරීම
පහත නම සඳහන් නිලධාරි 2006 ජූලි මස 31 දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.
නි/2280 කපිතන් (තාවකාලික මේජර්) අත්තනායක ආරච්චිලාගේ තිලක් කුමාර, ශ්‍රීලංජාආබමු.
විශ්‍රාම ගැන්වීම
පහත නම සඳහන් නිලධාරි 2006 අගෝස්තු මස 01 දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.
නි/2280 මේජර් අත්තනායක ආරච්චිලාගේ තිලක් කුමාර, ශ්‍රීලංජාආබමු
අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.
2006 මැයි මස 19 වැනි දින,
කොළඹ දී ය.
09-545

2006 අංක 281
ඩීවීඑස්/ආර්ථසීටී/9ඒවයි(1).
ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්
පහත නම සඳහන් නිලධාරි 2006 මාර්තු මස 01 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්චා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.
නි/4450 කපිතන් තිලකරත්න කුරුකුලආරච්චි, ශ්‍රීලයුපොදුසේබ.
අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.
2006 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.
09-606

2006 අංක 282
ඩීවීඑස්/ආර්ථසීටී/22 (vii) ඒවයි.
ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බල සේනාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්
පහත නම සඳහන් නිලධාරියා 2005 ඔක්තෝබර් මස 15 වන දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.
නි/4681 ලුතිනන් (උපකරණ පාලක) මාපා මුදියන්සේලාගේ වීරසේකර, ශ්‍රීලංසිරෙ
අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී, ආර්එස්සී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.
2006 මාර්තු මස 09 වැනි දින.
කොළඹ දී ය.
09-601

අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 283
අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :
ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, බී. ජී. පී. එස්. ද එස්. සේනාරත්න මහත්මිය 2006 පෙබරවාරි මස 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්.
09-635/1

2006 අංක 284
අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :
ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ආර්. ආර්. එම්. අමරතුංග මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්.
09-635/2

2006 අංක 285
අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :
ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, දයා පීරිස් මහත්මිය වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වශයෙන්.
09-648

ආණ්ඩුවේ නිවේදන

වෙරළ සංරක්ෂණ පනතේ 16 වැනි වගන්තියේ 2 (ආ) වන උප වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

යෝජිත මාගම –කිරින්ද වෙරළ තීරයෙන් ගානට් සහ ඉල්මනයිට් බණිජ වැලි කැණීම් හා පිරිසැකසුම් කිරීමේ ව්‍යාපෘතිය

පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 16 (1) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව අංක 873, කැලණිය ETA ලංකා ස්වභාවික සම්පත් (පෞද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කරන ලද "මාගම – කිරින්ද වෙරළ තීරයෙන් බණිජ වැලි කැණීමේ හා පිරිසැකසුම් කිරීමේ ව්‍යාපෘතිය" සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ. ව. 9.00 සිට ප. ව. 4.45 දක්වා 2006.09.01 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන්හි පරීක්ෂා කළ නොහැක.)

1. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය – නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.
2. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව – නව මහලේකම් කාර්යාලය, 4 වන මහල, මාලිගාවත්ත, කොළඹ 10.
3. මධ්‍යම පරිසර අධිකාරිය – හම්බන්තොට
4. නාගරික සංවර්ධන අධිකාරිය – හම්බන්තොට
5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය – හම්බන්තොට
6. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය – තිස්සමහාරාමය
7. ප්‍රාදේශීය සභාව – තිස්සමහාරාමය

මෙම යෝජිත මාගම – කිරින්ද වෙරළ තීරයෙන් ගානට් සහ ඉල්මනයිට් බණිජ වැලි කැණීම් හා පිරිසැකසුම් කිරීමේ ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2006.09.01 දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

ආචාර්ය ආර්. ඒ. ඩී. බී. සමරනායක,
වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ.

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල, මාලිගාවත්ත, කොළඹ 10
දුරකථන අංක 011 : 2449754, 011-2387922, 011-2472623
ෆැක්ස් අංක : 0112-438005, 0112-472623.
09-571

වෘත්තිය හා කාර්මික පුහුණු කිරීම් අමාත්‍යාංශය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක

ආයතන නිල නාමය වෙනස් කිරීම පිළිබඳව දැනුම් දීමය

වෘත්තිය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට අයත් කටුනායක පිහිටි තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනයේ නිල නාමය 2005 වසරේ ඔක්තෝබර් මස 10 වැනි දින පැවති ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමත වූ පරිදි ඉංජිනේරු තාක්ෂණ ආයතනය යනුවෙන් වෙනස් කල බවත්, ඉදිරියේදී සිදු කරන සියලුම රාජකාරීමය කටයුතු වලදී එම නව නිල නාමය වන ඉංජිනේරු තාක්ෂණ ආයතනය ලෙස භාවිතා කරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයට අයත් දෙපාර්තමේන්තු, මණ්ඩල සහ සියලුම රජයේ ආයතන වලටත් පෞද්ගලික අංශයේ සියලු ආයතන වලටත් ශ්‍රී ලංකා මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
රාජගිරිය.
09-528

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කඳන්හේන බටහිර ග්‍රාම නිලධාරී වසමේ නාමය නාමල්තැන්න යනුවෙන් සංශෝධනය කිරීම

මගේ යොමුව : එච්ඒ/ජීඑන්/3/3/පොදු.

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයට අයත් තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 401 කඳන්හේන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නම 2006.09.08 දින සිට අංක 401 නාමල්තැන්න යනුවෙන් සංශෝධනය කරනු ලබන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. නාම සංශෝධනය කරනු ලබන ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත් වන ගම්වල නම් උපලේඛන අංක 01 හි සඳහන් වේ.

03. ඒ අනුව නාමල්තැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, පොලිස් බල ප්‍රදේශ, උප්පැන්න විවාහ හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශ, පළාත් පාලන ආයතන, ඡන්ද ප්‍රදේශය හා වසමේ කොට්ඨාශ මායිම් උපලේඛන අංක 02 හි සඳහන් වේ.

බී. ජී. කරුණාරත්න,
ලේකම්,

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
2006 අගෝස්තු මස 28 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 10.

උපලේඛන 01

ග්‍රාම නිලධාරී වසම් නාම සංශෝධනය කිරීම

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	දැනට පවතින වසමේ නම හා අංකය	නාම සංශෝධනයෙන් පසු වසම හා අංක
මහනුවර	තුම්පනේ	කඳන්හේන බටහිර	නාමල්තැන්න
	ගම - කඳන්හේන		

උපලේඛන 11

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	දැනට පවතින වසමේ නම හා අංකය	මහෙස්ත්‍රාත් උසාවිය/ පොලීසිය	උප්පැන්න, විවාහ, මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය	පළාත් පාලන ආයතනය	ඡන්ද ප්‍රදේශය	වසමේ මායිම්
මහනුවර	තුම්පනේ	කඳන්හේන බටහිර 401	ගලගෙදර	මැදසිය පත්තුව	තුම්පනේ	ගලගෙදර	1. උතුර පූජාපිටිය ප්‍රා. ලේ. කොට්ඨාශය 2. දකුණ අලවත්තේගම ග්‍රා. නි. කොට්ඨාශය 399 3. නැගෙනහිර හාරිස්පත්තුව ප්‍රා. ලේ. කොට්ඨාශය සහ අලවත්තේගම කොටසක් 4. බටහිර - 400 කඳන්හේන නැගෙනහිර

09-575

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

සීමාසහිත සෙලාන් බැංකුව-අම්බලන්ගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0240-02403641-101.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 අප්‍රේල් මස 07 වන දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ගාමිණී ඩේවිඩ් විසින් සහතික කරන ලද 2001 අගෝස්තු මස 28 දිනැති අංක 1976 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අළුත්ගම පදිංචි යාගම චාරක රංගජීත් ද සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිතුන්ලක්ෂ හතලිස්හත්දහස් තුන්සිය තිස් දෙකයි ශත පනහක (රු. 23,47,332.50) මුදලක් 2005 ජූලි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 23,47,332.50 ක මුදලද, 2005 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1976 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තර වලල්ලාවිටි කෝරළේ කොස්ගොඩ ගොඩගම පිහිටි නන්දේලියනරාලලාගේ වත්ත හෙවන් පාලවත්ත නමැති බිම සහ ගස්, ගොඩනැගිලි, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩමට මායිම්, උතුරට : වෙලන්ගොඩට යන ගම්සභා පාර ද, නැගෙනහිරට : තෙන්කුට්ටි අදිරියන් හෙවන් අගෝරිස් පදිංචිවුවුන්වත් අබික්කගේවත්ත සහ පාලුවත්ත, දකුණට : පාලුවත්ත සහ බස්නාහිරට : එල්. එම්. විජේසිරිවර්ධන මුහන්දිරම් ට අයිති ගොඩැල්ලවත්ත යන මායිම් තුළ රූඩ් කුනයි පර්චස් දෙකක් (අ. 0, රූ. 3, පර්. 2) විශාල ඉඩම. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 381/44 යටතේ ලියා පදිංචි කර ඇත.

පෙරකී ඉඩම මිනුම් සැලැස්මක පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තර වලල්ලාවිට කෝරළේ කොස්ගොඩ ගොඩගම පිහිටි නන්දේලියනරාලලාගේ වත්ත හෙවන් පාලවත්ත ඉඩමේ ඒ ලකුණු කල බිම සහ ගස්, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩමට මායිම්, උතුරට : වෙලන්ගොඩට යන ගම්සභා පාර ද, නැගෙනහිරට : තෙන්කුට්ටි අදිරියන් හෙවන් අගෝරිස් පදිංචිවුවුන්වත් අබික්කගේවත්ත සහ පාලුවත්ත, දකුණට : පාලුවත්ත සහ බස්නාහිරට : එල්. එම්. විජේසිරිවර්ධන මුහන්දිරම් ට අයිති ගොඩැල්ලවත්ත යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු ඩී. බර්ටි ඒ ද සිල්වා විසින් සාදන ලද 1986.02.26 දිනැති අංක 2450 දරන සැලැස්ම අනුව රූඩ් තුනයි පර්චස් දෙකක් (අ. 0, රූ. 3, පර්. 2) විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.
09-594/3

සීමාසහිත සෙලාන් බැංකුව-අම්බලන්ගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0240-2512060-001

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.10 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද 1995 ඔක්තෝබර් 12 දිනැති අංක AMB/VEH/95002 සහ 1995 ඔක්තෝබර් 18 දිනැති අංක AMB/VEH/95003 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම බලපිටිය, "බලපිටිය ට්‍රේඩර්ස්" හි කොටස්කරුවන් වන මල්ලියා වඩු ලෝලිත ප්‍රසාද් ද සිල්වා සහ මල්ලියා වඩු ඇන්ඩෘ නිකලස් සීසර් ද සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකොලොස් ලක්ෂ දාහතරදහස් අටසිය දහඅටයි ශත නවයක (රු. 11,14,818.09) මුදලක් 2005 ජූලි 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 11,14,818.09 මුදල ද, 2005 අගෝස්තු 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ විදයම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක : AMB/VEH/95002 සහ AMB/VEH/95003 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති චංචල දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

1. වාහනය ලියාපදිංචි අංක : 42 ශ්‍රී 2331
   වාහනයේ වර්ගය : අළුත් ලංකා අශෝක් ලේලන්ඩ් ලොරිය
   එන්ජින් අංකය : ALEN 101462
   චැසි අංකය : LALG 00638
   1995 ඔක්තෝබර් 12 දිනැති අංක : AMB/VEH/95002 දරන උකස් බැඳුම්කරය.
   මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාකර්යාලයේ අංක : 05/207 හි ලියාපදිංචි කර ඇත.
2. වාහනය ලියාපදිංචි අංක : 47-8020
   වාහනයේ වර්ගය : එයිවර් මිටිසුබිෂි ඩීසල් ලොරිය, අශ්ව බල 92.5
   එන්ජින් අංකය : I-50627285
   චැසි අංකය : 4EC 50734750

1995 ඔක්තෝබර් 18 දිනැති අංක AMB/VEH/95003 දරන උකස් බැඳුම්කරය. මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ චංචල 05/208 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.
09-594/1

සීමාසහිත සෙලාන් බැංකුව-වරකාපොල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0700-09754560-101

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005 මැයි මස 13 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එම්. එස් ද සේරම් විසින් සහතික කරන ලද 1998.08.05 දිනැති අංක 26 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වරකාපොල පදිංචි ජෝසප් මුහන්දිරම්ලාගේ බන්දුල ප්‍රේමසිරි සහ ගම්ලත් රාලලාගේ ගෘහාමා නිලන්ති යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ දාහත්දහස් පන්සිය අනූඅටයි ශත දහනවයක් (රු. 3,17,598.19) මුදලක් 2004 නොවැම්බර් 30 වැනි දින වැනි විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 3,17,598.19 මුදල ද, 2004 දෙසැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක AMB/VEH/95003 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම බලපිටිය, "බලපිටිය ට්‍රේඩර්ස්" හි කොටස්කරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ එගොඩපොත පත්තුවේ, කිතලන්ගමුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. රූපශ්‍රී ආනන්ද විසින් සාදන ලද 1982 ජූනි 01 දිනැති අංක 425 දරන සැලැස්මේ සඳහන් දවල්හැබේ වත්ත සහ ඉන නැමැති ඉඩමේ කැබැලි අංක 1 ලකුණු කල බෙදා වෙන් කල ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : පොල්කොටුව හෙවන් කදුරුගල පල්ල ද, නැගෙනහිරට : කැබලි අංක 5 ද, දකුණට : කැබලි අංක 3 සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස් නවයයි දශම තුනයි පහක් (අ. 0, රූ. 01 පර්. 39.35) විශාල, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම. පෙර ලියාපදිංචිය එස් 83/102.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,
සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.
09-594/4

මහජන බැංකුව - දංකොටුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.03.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2003.12.30 දිනැති අංක 1240 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සමරප්පෙරුම ආරච්චිගේ චෝල්ටර් සමරප්පෙරුම යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් අටලක්ෂ තිස්තුන් දහස් අනූහයයි ශත හැත්තෑ එකක (රු. 8,33,096.71) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2005.02.07 දින සිට වර්ෂයකට 18.25% බැගින් රුපියල් අටලක්ෂ තිස්තුන් දහස් අනූහයයි ශත හැත්තෑ එකක (රු. 8,33,096.71) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29එල්) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් වෛවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් අටලක්ෂ තිස්තුන්දහස් අනූහයයි ශත හැත්තෑ එකක (රු. 8,33,096.71) මුදල අයකර ගැනීම සඳහා බලාවත බලයලත් වෙන්දේසිකාර ඩී. එල්. ජේ. නිශ්ශංක මහතා විසින් එකී අංක 1240 දරන උකස්කරය යටතේ, එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපල පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයට අයත් දකුණු පිටිගල් කෝරළයේ ඕතර පළාතේ, මැටිකොටුව නමැති ගමේ පිහිටි දිවුල්ගහවත්ත, කොස්ගහවත්ත, දැනට සියඹලාගහවත්ත, කහටගහවත්ත, හල්ගහවත්ත බෙදූ කොටස සහ කොහොඹගහවත්ත සහ කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. ජී. මෙල්ටන් සමරතුංග මහතා විසින් 1986.10.10 වැනි දින මැන බෙදා වෙන් කරන ලද අංක 2618 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 03 දරන කොටසට මායිම්, උතුරට : එකී ඉඩමෙන් පාරක් වශයෙන් වෙන් කර තිබෙන අඩි 10ක් පළල අංක 01 දරන බිම් තිරය ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් අංක 04 දරන කොටස සහ ජී. ධම්පිසිංහේගේ ඉඩම ද, දකුණට : එකී පිඹුරේ අංක 02 දරන කොටස ද, බස්නාහිරට : එකී පිඹුරේ අංක 02 දරන කොටස ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි, රූඩ් එකයි, පර්චස් දහ තුනයි දශම අටයි හතර (අ. 02, රූ. 0, පර්. 13.84) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියළු දේත් වේ.

ඉහත පිඹුරේ උතුරු මායිමේ ලොට් අංක 01න් පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි දෙකයි නවය (හෙ. 0.0329)ක් විශාල අඩි 10ක පළල පාරක් සඳහා වෙන් කළ බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් භාවිත කිරීමේ මාර්ග පරවශ්‍යතාවය ද සමඟ වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 71/108 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකාර-හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.
09-650

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 158101.

2006ක් වූ ජූලි මස 14 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සී. එම්. ඒ. කේ. ජයවර්ධන විසින් සහතික කරන ලද 2002 පෙබරවාරි මස 25 වැනි දින අංක 1332 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කරය යටතේ අදාසූරිය මොහොට්ටලාගේ නිමල් අදාසූරිය යන අය බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්එක්දාස් අටසිය පනස්හතයි ශත විසිහයක (රු. 2,31,857.26) මුදලක් 2006 ජූනි මස 20 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දෙලක්ෂ තිස් එක්දහස් අටසිය පනස් හතයි ශත විසිහයක (රු. 2,31,857.26) මුදල හා 2006 ජූනි මස 21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,458.30 ක මුදලක් සඳහා වාර්ෂිකව 20% බැගින් වූ පොලිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 1332 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය, මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ මහකෙළිය කැලිමුන සහ හබරගම ගම්වල පිහිටි මහකෙළිය එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද 1997 ඔක්තෝබර් මස 2 වැනි දින අංක161/97 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන්කළ ලොට් 204 දරන ඉඩමට මායිම් එනම් උතුරට : ලොට් 205 (පාර) නැගෙනහිරට : ලොට් 89 (පාර), දකුණුට : ලොට් 203 හා බස්නාහිරට : ලොට් 206 න්ද යන මෙහි මායිම් තුළ ඉහත කී පිඹුරු අංක 161/97 පරිදි ප්‍රමාණය පර්චස් පහලොවක් (අක්. 0, රූඩ් 0, පර්. 15) විශාල ඉඩම හා එහි තුළ පිහිටි සියලු දේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1200/119 හි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

09-591/2

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1540008877.

ණය ගිණුම් අංකය : 232717.

2006 ක්වූ ජූලි මස 14 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සී. සමරසේකර විසින් සහතික කරන ලද 2005 මාර්තු මස 16 වැනි දින අංක 3054 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කරය යටතේ නාලි ගමගේ ගාමිණී යන අය බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැට එක්දාස් අනූහයයි ශත විසිදෙකක (රු. 1,61,096.22) මුදලක් 2006 මැයි මස 19 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්ලක්ෂ හැට එක්දාස් අනූහයයි ශත විසිදෙකක (රු. 1,61,096.22) මුදල හා 2006 මැයි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,37,500 ක මුදලක් සඳහා වාර්ෂිකව 20% බැගින් වූ පොලිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 3054 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය, මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතල දිස්ත්‍රික්කයේ, කන්දපල්ල කෝරළේ (ගලේවෙල ප්‍රාදේශීය කොට්ඨාශය) තලකිරියාගම ගමේ පිහිටි කිරලගොල්ල ඉඩමේ ලොට් 01 ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූඩ් 01, පර්. 0) විශාල ඉඩමට බලයලත් මානක එල්. ඩී. මොල්ලිගොඩ විසින් මැන සාදන ලද 2004 ජූලි මස 29 වැනි දින අංක 4476 දරන පිඹුර ප්‍රකාරව එකී ලොට් 01 ට මායිම්, එනම් උතුරට : ලීනා උදයංගනී විසින් හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 1046 ලොට් 01 න් ද, දකුණට : පාරෙන් ද, බස්නාහිරට : පිඹුරු අංක 1046 හි සඳහන් ලොට් 2 හි ඉතිරි කොටසින් ද හා එහිතුළ පිහිටි සෑම සියලු දේද වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ-ඩී 115/73 හි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

09-591/1

සීමාසහිත සෙලාන් බැංකුව-ස්ටාෆ් ඇඩ්වාන්ස් යුනිට්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0012-097777-000.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 ජූලි මස 26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ජී. සී. ලියනගේ විසින් සහතික කරන ලද 2001 අගෝස්තු මස 01 දිනැති අංක 106 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මොරටුව පදිංචි අල්බාර්තුලගේ සුහාෂ් චන්දන ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකොලොස් ලක්ෂ තිස්හතර දහස් තුන්සිය විසි හතරයි ශත අනූහයක් (රු. 11,34,324.96) මුදලක් 2005 ජූලි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 11,34,324.96 ක මුදල ද, 2005 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 106 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මොරටුව නගර සභා සීමාව තුළ කොරළවැල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ශ්‍රේෂන් එස්. පෙරේරා විසින් සාදන ලද 1981 අගෝස්තු 25 දිනැති අංක 760 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් කොන්ස්ටන්ටයින් පටුමගේ වරිපනම් අංක 40/3 දරන වරිපනම් අංක 20/13සී සහ 20/13ඩී (කොටසක්) දරන මඩගහවත්ත සහ පයුරුගහවත්ත නමැති, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ (බලයලත් මිනින්දෝරු එව්. එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1972.12.24 දිනැති අංක 6106 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ 2 කැබැල්ලෙහි නැවත මැනීමක් වන (බෙදා වෙන් කරන ලද ඒ 2 ඉඩම් කොටසට මායිම් උතුරට : ජේ. ඒ. පෙරේරා ගේ දේපල ද නැගෙනහිරට: මෙම ඉඩමේ කැබැලි අංක ඒ 3 ද, දකුණට : අඩි පාර (අඩි 4 ක් පළල) සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඒ 1 කැබැල්ල ද ය න මායිම් තුළ එකී අංක 760 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.65) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2555/5 හි ලියා පදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල.,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

09-594/2

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීඑල්/09/205/ජීඒ1/435.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.06.07 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. මාතර ප්‍රසිද්ධ නොතාරිස් සී. ඩබ්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2004.10.25 දින හා අංක 18397 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම වැලිගම පදිංචි තුඩාව පක්තිනිගේ පියසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.05.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හැට්අටදහස් හාරසිය තිස් නවයයි ශත දෙක (රු.68,439.02) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 18397 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් විසිදෙකයි ශත හැටනවය (රු. 22.69) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල හා 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14 හි බලයලත් වෙන්දේසිකාර එන්. එව්. පී. එස්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ කිරින්ද ග්‍රාමයේ පුහුල්වැල්ල සිට ආරන්‍ය පාර දක්වා දිවෙන ගම් සභා පාරේ පිහිටි මැදකොරවුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එව්. ජේ. සමරපාල විසින් සකසන ලද අංක 1474 සහ 2001.03.07 දිනැති මිණුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 26 ක් වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේන් සමඟ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2006 සැප්තැම්බර් මස 01 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.
09-633/5

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ගැණුනු යෝජනාව

ණය අංකය : 10/59074/ඩී10/301.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.05.22 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජේ. අත්ථානහේන්නදි විසින් සහතික කරන ලද 1996.07.16 දින හා අංක 1451 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම නාකුළුගමුව පදිංචි මාකලූරගේ සමන්ත සංජීව යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.04.10 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හතලිස් තුන්දහස් දෙසිය හැටයි ශත තිහ (රු.2,43,260.30) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1451 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් තිස් හතයි ශත අනූහය (රු.37.96) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදය දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගතයුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධිත සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, අලුත්කඩේ වීදිය, අංක 99, සේන හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම හි බලයලත් වෙන්දේසිකාර ටී. සී. සේනානායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය සභා සීමාව තුළ ගලගම පිහිටි වැල්මීයන්හේන නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එව්. බී. ජේ. පාලිත විසින් සකසන ලද 1996.02.16 දින සහ අංක 1154 දරන පිඹුරේ දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, පර්. 24.87 ක් වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේන් සමඟ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2006 සැප්තැම්බර් මස 01 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.
09-633/4

මුද්‍රණය හා බෙදාහැරීම සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk

ආණ්ඩුවේ දැන්වීම්

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 104

මගේ අංකය : **3/2/4/74/බ**
යොමු අංකය : එල්ඩි/**2004**/එච්ඩබ්ලිව්/**77**

පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ආණ්ඩුවට ගැනීමට අදහස් කර තිබේ. වැඩි විස්තර සඳහා අංක 1431/33 හා 2006.02.10 දින දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* III වන කොටස බලන්න.

ජී. ඩී. අශෝකා ස්වර්ණලතා,
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2006 පෙබරවාරි මස 06 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

උපලේඛනය

ගමේ නම හා විස්තරය	:	වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ 645, හෙට්ටිපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හෙට්ටිපොල ගම
ඉඩමේ නම	:	මාලියද්ද කුඹුර
පිඹුරු අංකය හා කැබලි අංකය	:	අ. ග. පි. 1090, කැබලි අංක 45
ප්‍රමාණය	:	හෙක්ටයාර් 0.0026
ගමේ නම හා විස්තරය	:	වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ 645, හෙට්ටිපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හෙට්ටිපොල ගම
ඉඩමේ නම	:	ගලගාව ලියද්ද
පිඹුරු අංකය හා කැබලි අංකය	:	අ. ග. පි. 1090, කැබලි අංක 46
ප්‍රමාණය	:	හෙක්ටයාර් 0.0025

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (400 වන පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 105

මගේ අංකය : **3/2/4/74/එච්**
යොමු අංකය : එල්ඩි/**05/2004**/එච්ඩබ්ලිව්/**82**

පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ආණ්ඩුවට ගැනීමට අදහස් කර තිබේ. වැඩි විස්තර සඳහා අංක 1431/33 හා 2006.02.10 දින දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* III වන කොටස බලන්න.

ජී. ඩී. අශෝකා ස්වර්ණලතා,
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2006 පෙබරවාරි මස 06 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

උපලේඛනය

ගමේ නම හා විස්තරය	:	වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ 645, හෙට්ටිපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිලැස්ස ඉහළගම ගම.
ඉඩමේ නම	:	බතල වත්ත
පිඹුරු අංකය හා කැබලි අංකය	:	මු. පි. කු. 2129 කැබලි අංක 01
ප්‍රමාණය	:	හෙක්ටයාර් 0.0011

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 106

මගේ අංකය : **3/2/4/74 ඒ**
යොමු අංකය : එල්ඩි **05/2004**/එච්ඩබ්ලිව්/**79**

පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ආණ්ඩුවට ගැනීමට අදහස් කර තිබේ. වැඩි විස්තර සඳහා අංක 1431/34 හා 2006.02.10 දින දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* III වන කොටස බලන්න.

ජී. ඩී. අශෝකා ස්වර්ණලතා,
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2006 පෙබරවාරි මස 06 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

උපලේඛනය

ගමේ නම හා විස්තරය	:	වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ මාවතගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාවතගම ගම.
ඉඩමේ නම	:	සීසිලීඩි වත්ත
පිඹුරු අංකය හා කැබලි අංකය	:	මු. පි. කු. 2131, කැබලි අංක 01
ප්‍රමාණය	:	හෙක්ටයාර් 0.0052
ගමේ නම හා විස්තරය	:	වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ මාවතගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාවතගම ගම.
ඉඩමේ නම	:	පරගහකුඹුරේ පිල්ලෑව
පිඹුරු අංකය හා කැබලි අංකය	:	මු. පි. කු. 2131, කැබලි අංක 02
ප්‍රමාණය	:	හෙක්ටයාර් 0.0005
ගමේ නම හා විස්තරය	:	වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 678 මාවතගම උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාවතගම ගම
ඉඩමේ නම	:	පහළ කෝවිල කුඹුර
පිඹුරු අංකය හා කැබලි අංකය	:	මු. පි. කු. 2131, කැබලි අංක 03
ප්‍රමාණය	:	හෙක්ටයාර් 0.0105

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 107

මගේ අංකය : **3/2/4/74ජ**
යොමු අංකය : එල්ඩි /**05/2003**/එච්ඩබ්ලිව්/**611**

පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ආණ්ඩුවට ගැනීමට අදහස් කර තිබේ. වැඩි විස්තර සඳහා අංක 1431/33 හා 2006.02.10 දින දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* III වන කොටස බලන්න.

ජී. ඩී. අශෝකා ස්වර්ණලතා,
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2006 පෙබරවාරි මස 06 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

උපලේඛනය

ගමේ නම හා විස්තරය	:	වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ 695, පිලැස්ස ඉහළගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිලැස්ස ගම
ඉඩමේ නම	:	වැව් කොටුව
පිඹුරු අංකය හා කැබලි අංකය	:	මු. පි. කු. 2136, කැබලි අංක 01
ප්‍රමාණය	:	හෙක්ටයාර් 0.0027
ගමේ නම හා විස්තරය	:	වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ 695, පිලැස්ස ඉහළගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිලැස්ස ගම.
ඉඩමේ නම	:	මකුන්දාවෙල පිල්ලෑව
පිඹුරු අංකය හා කැබලි අංකය	:	මු. පි. කු. 2136, කැබලි අංක 02
ප්‍රමාණය	:	හෙක්ටයාර් 0.0062

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 108

මගේ අංකය : **3/2/4/74/ඒ**
යොමු අංකය : එල්ඩි /**05/2004**/එච්ඩබ්ලිව්/**83**

පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ආණ්ඩුවට ගැනීමට අදහස් කර තිබේ. වැඩි විස්තර සඳහා අංක 1431/34 හා 2006.02.10 දින දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* III වන කොටස බලන්න.

ජී. ඩී. අශෝකා ස්වර්ණලතා,
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2006 පෙබරවාරි මස 06 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.,

උපලේඛනය

ගමේ නම හා විස්තරය	:	වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ 672 මී/පල්ලේගම නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මීතැන්වල ගම
ඉඩමේ නම	:	සීසිලීඩි වත්ත
පිඹුරු අංකය හා කැබලි අංකය	:	මු. පි. කු. 2130, කැබලි අංක 01
ප්‍රමාණය	:	හෙක්ටයාර් 0.0243

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 109

මගේ අංකය : **4/3/1/12/එල්/ඩ/05/2002/1100/299**.

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා අංක 1420/31 දරන 2005.11.23 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය* බලන්න.

එච්. එම්. පී. හිටිසේකර,
ප්‍රාදේශීය මහ ලේකම්.
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය.

2005 අගෝස්තු මස 30 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	:	කුරුණෑගල
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	:	කුරුණෑගල
ග්‍රාම සේවක කොට්ඨාසය	:	834-කුරුණෑගල නගරය ඊසාන, 833 කුරුණෑගල නගරය නැගෙනහිර, 840 කුරුණෑගල නගරය කඩවිදිය
ගම	:	-
ඉඩමේ නම	:	-
සැලසුම් අංකය	:	මු. පි. කො. 2138
කැබලි අංකය	:	01 සිට 84 දක්වා

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 110

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා අංක 1415/05 දරන 2005.10.17 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය* බලන්න.

බී. ඒ. එම්. පී. අබේරත්න,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරගම.

2005 ජුනි මස 12 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දීය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	:	කළුතර
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	:	බණ්ඩාරගම
ගමේ නම	:	මහවිල
ඉඩමේ නම	:	දෙල්ගහවත්ත කුඹුර
සැලසුම් අංකය	:	3477
කැබලි අංකය	:	97
ප්‍රමාණය	:	හෙක්. 0.0045

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
Sri Lanka Institute of Printing

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය

(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන මුද්‍රණ ක්ෂේත්‍රයට අදාළ පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය පිළිබඳ පාඨමාලාව

Certificate Course in Costing and Estimating for Printing Industry

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥා පනත මගින් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා මුද්‍රණ කර්මාන්තයේ ප්‍රථම වෘත්තීය සන්ධානය වූ තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් මුද්‍රණ ක්ෂේත්‍රයට අදාළ පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව ඔක්තෝබර් මස ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

මෙම පාඨමාලාව මුද්‍රණ ක්ෂේත්‍රයේ නියුතු ඇස්තමේන්තුකරුවන්, ගණකාධිකරණයේ නියැළි නිලධාරීන්, මුද්‍රණ සුපවයිසර්වරුන් සහ කළමනාකාරවරුන්ට මෙන්ම මුද්‍රණ අලෙවිකරණයේ යෙදී සිටින නිලධාරීන්ට ද අතිශයින් ප්‍රයෝජනවත් වන අතර මුද්‍රණ ක්ෂේත්‍රයට ඇතුළුවන නවකයින්ට ද මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වනු ඇත.

එමෙන්ම මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය හා කොළඹ විශ්ව විද්‍යාලය එක්ව මෙහෙයවන මුද්‍රණ ශිල්පය හා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය මූලික සුදුසුකම් ලබා දෙයි. (Advanced Diploma in Printing Technology and Management)

මෙම පාඨමාලාව අඟහරුවාදා සහ සිකුරාදා දිනවල ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා පුරා සති 27 ක් පැවැත්වේ.

පාඨමාලා කාලය : මාස 8යි.
මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි.

පාඨමාලාවේ අන්තර්ගතය :

Course Contents:

Estimating Module

Definition of an Estimate
* Estimate as a sales tool
* Estimating as a production tool

Estimating Practices
* Standard Methods

Estimating of Material and Operation Times
Estimating Electronics and Conventional Pre-Press
Estimating Press Operations
Estimating Digital Printing
Estimating Post Press Operations
Estimating paper, inks and other materials
Computerised managing Information System(MIS)
Application of Estimating and costing software packages

Costing Module

Definition and Elements of Cost
Introduction to printing processors and applications
Costing methods and its relevance to the industry
Inventory and material control
Labour cost control
Absorption costing and marginal costing
Fixed cost, Variable costs and Depreciation
Budget Centres
Budgeting and Managing cost accounting information
Budgeted hourly rates
Developing BHRs for your company

මේ පිළිබඳ උනන්දුවක් දක්වන අය වෙතොත් පහත ලිපිනයෙන් හෝ දුරකථනයෙන් අමතා ලියාපදිංචි විය හැක.

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.

දුරකථන : 2686162, 2679791
ෆැක්ස් : 2686162
ඊමේල් : sliopreg@sri.lanka.net